# කලා විෂය ධාරාව යටතේ අධ්‍යාපනයට නැඹුරු වීමේ ප්‍රවණතාවය සහ කලා උපාධිධාරීන්ගේ රැකියා වියුක්තිය




**වාර්තාවේ අංකය : PER/A/HED/A/2019/4**

## ජාතික විගණන කාර්යාලය

## පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
| --- | --- | --- |
| 1. | විධායක සාරාංශය | 1 |
| 2. | හැඳින්වීම | 3 |
| 2.1 | පසුබිම | 3 |
| 2.2 | විගණනය සඳහා අධිකාරි බලය | 5 |
| 2.3 | විගණන ප්‍රවේශය | 5 |
| 2.4 | විගණන ක්‍රමවේදය | 6 |
| 2.5 | විගණන අරමුණු හා නිර්නායක | 7 |
| 2.6 | විගණන විෂය පථය | 8 |
| 3. | විගණන නිරීක්ෂණ | 10 |
| 3.1 | අධ්‍යාපන ප්‍රතිපත්ති | 10 |
| 3.1.1 | අධ්‍යාපන ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම (පාසල් සාමාන්‍ය අධ්‍යාපන අංශ සඳහා) | 10 |
| 3.1.2 | නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සංශෝධන | 11 |
| 3.1.3 | අධ්‍යාපන අමාත්‍යාංශයේ සූදානම | 12 |
| 3.2 | විශ්ව විද්‍යාල අධ්‍යාපනය | 26 |
| 3.2.1 | උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 26 |
| 3.2.2 | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම | 27 |
| 3.2.3 | කලා උපාධි පාඨමාලා වෙත යොමු වීම | 28 |
| 3.2.4 | නව පාඨමාලා නිර්මාණය කිරීම හා හඳුන්වා දීම | 30 |
| 3.2.5 | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව, වරප්‍රදාන (ප්‍රතීතන) හා ප්‍රමිති සුරැකුම් මණ්ඩලයක් පිහිටුවීම සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ සභාවක් පිහිටුවීම | 31 |
| 3.3 | සේවා නියුක්තිය හා කලා විෂය ධාරාව | 31 |
| 3.3.1 | රැකියා සඳහා යොමුවන ක්ෂේත්‍රය | 31 |
| 3.3.2 | සමස්ත උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සම්බන්ධ පර්යේෂණය | 33 |
| 3.3.3 | ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය | 41 |
| 3.3.4 | ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතනවල මැදිහත්වීම | 44 |
| 3.3.5 | උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය සම්බන්ධ රාජ්‍ය මැදිහත්වීම | 44 |
| 3.3.6 | තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව | 45 |
| 3.3.7 | කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | 45 |
| 3.3.8 | විරැකියාව සම්බන්ධ දත්ත පවත්වා ගැනීම | 46 |
| 4. | නිර්දේශ | 47 |

## 01. විධායක සාරාංශය

මිලියන 21.3 ක් පමණ වන ශ්‍රී ලාංකේය ජනගහනය අතුරින් මිලියන 15.45 ක් වයස අවුරුදු 15 ට වැඩි, එනම් නීත්‍යානුකූලව සේවා නියුක්තිය සඳහා සුදුසු වයස් කාණ්ඩයන්ට අයත් වේ. එහෙත් වර්තමානයේ සේවා නියුක්තිය ඉන් අඩක් එනම් මිලියන 8.31 ක් පමණ වේ. රටේ සමස්ත රැකියා විරහිතභාවය ආසන්න වශයෙන් තරුණ/තරුණියන් 362,999 ක් පමණ ඉතා ඉහළ අගයක්ව පවතී. මෙම තරුණ තරුණියන්ට සුදුසු රැකියා අවස්ථා නොලැබීයාම අනාගතයේ ජාතික වශයෙන් ඉතා අවදානම් තත්ත්වයකට මඟ පෑදිය හැකිය. එසේම රැකියා විරහිත අය අතුරින් සියයට 38.4 ක් වර්ෂයකට අධික කාලයක් සුදුසු රැකියාවක් සොයමින් සිටින අය බව සමීක්ෂණ දත්ත අනුව වාර්තා වී ඇත. මින් වැඩි ප්‍රතිශතයක් නියෝජනය වන්නේ කලා උපාධිධාරීන් බව මෙහිදී කැපී පෙනුනි. මේ අතර වාර්ෂික ශ්‍රම බලකායට අළුතින් 200,000 ක් පමණ එකතු වේ. වාර්ෂිකව රාජ්‍ය අංශයේ පුරප්පාඩු 20,000 ක් ද පෞද්ගලික අංශයේ පුරප්පාඩු 120,000 ක් පමණ ඇතිවන නමුත් සියළු සේවා වියුක්තිකයින් ඊට අවශෝෂණය වීමක් සිදුනොවේ.

මෙම මිලියන 21 ක ජනගහනයෙන් මිලියන 8.31 ක් පමණ සේවා නියුක්ත වීමේදී ඉතා ඉහළ යැපීම් අනුපාතයක් නිරීක්ෂණය වන අතර අනාගතයේදී වයස්ගත ජනගහනයේ ඉහළ යාමත් සමඟ මෙම යැපීම් අනුපාතිකය තිරසාර වශයෙන් දරාගැනීමේ හැකියාවක් නොමැතිවීමේ අවදානමක් පවතින බැවින් මේ සඳහා එකම විකල්පය වනුයේ වහාම සේවා නියුක්තිය ඉහළ දැමීම බව හඳුනාගතහැකි විය.

ශ්‍රම ආර්ථික සමීක්ෂණ අනුව ලංකාවේ ජනගහනයෙන් අති බහුතරය වැඩ කළ හැකි වයසේ සිටීම. ජනගහන සංයුතියේ ලාභාංශය (Demographic dividend) රටක් වශයෙන් වේගවත් ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීම සඳහා මහඟු අවස්ථාවක් සලසා දී ඇති අතර එය මනාව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය මගින් අවධාරණය කර ඇත. මේ අනුව දිනෙන් දින විවිධ මාධ්‍ය මගින් නිරූපනය කරන ආකාරයට ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවයෙන් පෙලෙන උපාධිධාරීන් විශේෂයෙන් කලා උපාධිධාරීන් මෙන්ම උසස් පෙළ කලා විෂයධාරාවෙන් අධ්‍යාපනය හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලැබූ සිසුන්ගේ සේවා වියුක්තිභාවය ගැටළුකාරී වී ඇති බැවින් ඒ පිළිබඳ අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම ඇගයීම පිණිස මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදි.

මෙම විගණනයේ විෂය පථය වූයේ රජයේ පාසල්වල සිසුන් අ.පො.ස (උ.පෙල) විෂය ධාරාව සඳහා කලා විෂය තෝරා ගැනීමට හේතු වූ පසුබිමේ සිට රජයේ විශ්ව විද්‍යාලයකින් අභ්‍යන්තර සිසුවකු ලෙස කලා මාධ්‍යයෙන් ප්‍රථම උපාධිය ලබා රැකියාගතවීම තෙක් අදියරයන් නියැදි පදනමින් පරීක්ෂාවට ලක් කිරීමයි.

ලොව සියළු සමාජ තලවල කලාව අනිවාර්යයෙන්ම පැවතිය යුක්තකි. එය මානව සමාජයේ යහපැවැත්ම උදෙසා අත්‍යාවශ්‍ය අංගයකි. ඒ අනුව පාසල් මට්ටමින්, විශ්වවිද්‍යාල මට්ටමින්

සාහිත්‍යකරුවන්, රංගධරයන්, සිනමාවේදීන්, සංගීතඥයන්, චිත්‍ර ශිල්පීන් වශයෙන් විවිධ තලවල වෘත්තීමය කලාකරුවන් බිහිකරවීමට ප්‍රමුඛ දායකත්වයක් සැපයිය යුතු මෙන්ම සෞන්දර්යයවාදී චින්තනයක් සහිත මිනිසුන් බිහිකිරීමට පොදුවේ කලාවිෂය ධාරාව ඉමහත් මෙහෙයක් සිදුකරන බව අවිවාදිතය.

නමුත් ආර්ථික වර්ධන වේගය සියයට 2.7 ක් තරම් පහල අගයක සිටින හා ශ්‍රම බලකායෙන් සියයට 4.3 ක් සේවා වියුක්තව සිටින ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක අධ්‍යාපනය ආර්ථික සංවර්ධනය කරා යොමුවීම මෙන්ම අධ්‍යාපනය හා රැකියා නියුක්තිය අතර නොගැලපීම ද අවම කල යුතුය. ඒ අනුව මෙම කාර්යසාධන විගණනයේදී අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණ අතර ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය සඳහා කාලීනව සංශෝධනය වූ අධ්‍යාපන ප්‍රතිපත්තීන් නොමැතිව ඉගැන්වීමේ කාර්යයන් සිදුකෙරෙන බවත්, පාසල් මට්ටමේ පවතින මානව හා භෞතික පහසුකම්වල විෂමතා මත වැඩි සිසුන් පිරිසක් උසස් පෙළ සඳහා කලා විෂය ධාරාව තෝරාගන්නා බවත්, විශේෂයෙන් සිසුන්ට තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීමට බාධාවන් පවතින බවත්, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ගත්කල ඒවායේද කලා උපාධි පාඨමාලා කාලීනව සංශෝධනය වී නොමැති බවත්, ඉංග්‍රීසි භාෂා හා තොරතුරු තාක්ෂණමය දැනුම හා මෘදු කුසලතා වර්ධනය කර ගැනීම පිණිස පවතින ඉඩප්‍රස්ථා අවම බවත් නිරීක්ෂණය විය. එසේම රටේ මිනිස් බල සැලසුම් ප්‍රතිපත්තියක් 2018 වර්ෂයේදී සංශෝධනය කර තිබුණද එය ක්‍රියාත්මක කිරීමේ වගකීම ආයතන දෙකක් හරහා සිදුකිරීමට අපේක්ෂිත වූ නමුත් ඒ එකදු ආයතනයකින්වත් පවතින රැකියා ගැටළු හඳුනාගෙන ඒ සඳහා ස්ථිර සාර විසඳුම් ලබාදීමට අපොහොසත් වී තිබුණි.
මෙවැනි තත්ත්වයකදී 2012-2018 වර්ෂයන්වල උපාධිය සමත් වී ඇති උපාධිධාරීන් 54,824 ක් 2018 ජූනි 30 දින වන විට රැකියා විරහිතව සිටි අතර, 2019 සැප්තැම්බර් 18 වන විට අදියර 03 ක් යටතේ 19,920 ක් (එනම් සියයට 36 ක්) සඳහා පමණක් අභ්‍යාසලාභී උපාධිධාරීන් ලෙස පත්වීම් ලබාදීමට මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් පියවර ගෙන තිබුණි.

ඒ අනුව මෙකී ගැටළු අවමකර රටේ සේවා නියුක්තිභාවය වර්ධනය කිරීම සඳහා පවතින අධ්‍යාපන ප්‍රතිපත්ති වහාම කාලීන සංශෝධනයන්ට ලක් කල යුතු බවත්, දිවයිනේ පළාත් අතර අධ්‍යාපනයේ පවතින විෂමතා අවම කර සැමට සමාන මානව හා භෞතික අධ්‍යාපනික පහසුකම් ලබාදිය බවත්, තාක්ෂණවේදය වැනි වෘත්තීය අධ්‍යාපනික කුසලතා වැඩිදියුණු කරගත හැකි විෂයධාරාවන් තුළින් ඉගෙනුම් අවස්ථා වැඩිදියුණු කළයුතු බවත්, විශ්ව විද්‍යාලවල අධ්‍යාපන පාඨමාලා හා විෂයන් කාලීනව සංශෝධන විය යුතු බවත්, ඉංග්‍රීසි, තාක්ෂණය මෘදු කුසලතා යනාදී රැකියා වෙළඳපල කේන්ද්‍රකරගත් අනෙකුත් සුදුසුකම් වර්ධනයට ශිෂ්‍යයන්ට පහසුකම් තවදුරටත් වර්ධනය කරදිය යුතු බවත් නිර්දේශය කෙරේ.

## 2. හැඳින්වීම

### 2.1 පසුබිම

**(අ) පාසල් මට්ටම තුළ කලා විෂය ධාරාව වෙත යොමු වීම හා ඒ සඳහා ඇති උසස් අධ්‍යාපන පහසුකම්**

2018 වර්ෂය තුළ රජයේ පාසල් 10,175 ක ශිෂ්‍යයන් 4,215,487 ක් පාසල් අධ්‍යාපනය හදාරනු ලැබීය. මින් සියයට 75 ක ප්‍රමාණයක් අ.පො.ස. (උ.පෙළ) සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය වන අතර 2018 වසරේ අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි සමස්ත අයදුම්කරුවන් සංඛ්‍යාව 267,111 ක් වේ. මින් කලා විෂය ධාරාව යටතේ උසස් පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 105,398 ක් එනම් සියයට 39 ක් විය. මින් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන මුළු සිසුන්ගෙන් කලා උපාධිය හදාරනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස සියයට 30 ආසන්න මට්ටමක් වේ.
1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පාලනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාලවල කාර්යයන් නියාමනය කරන ප්‍රධානතම ආයතනය වන අතර දැනට එම කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාල 15 ක් ස්ථාපිත කර ඇත. මෙම රාජ්‍ය විශ්වවිද්‍යාල තුළින් කලා විෂය ධාරාවට සම්බන්ධ උපාධි පාඨමාලා අධ්‍යයනය පීඨ 14 ක් යටතේ ඇති දෙපාර්තමේන්තු 140 ක් මගින් උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබයි.

**(ආ) කලා උපාධිධාරීන් සඳහා දරන වියදම**

විශ්ව විද්‍යාල වල ඉගෙනුම ලබන සිසුන් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් දරන ලද වියදම් (පුස්තකාල සේවා, විභාග සහ වෙනත් වියදම් හැර) පිළිබඳ විස්තර පහත දැක්වෙන අතර ඉන් වැඩිම වියදමක් දරා ඇත්තේ කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා බව නිරීක්ෂණය වේ. ඒ අනුව සමස්ථ වියදමෙන් 2016,2017,2018 වර්ෂවල පිළිවෙලින් සියයට 23, සියයට 22, සියයට 22 ප්‍රතිපාදන කලා උපාධිධාරීන් වෙනුවෙන් වැයකර තිබුණි.

| | 2016 (රු'000) | ප්‍රතිශතය | 2017 (රු'000) | ප්‍රතිශතය | 2018 (රු'000) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| පීඨය | | | | | | |
| කලා | 4,211,628 | 23 | 4,497,595 | 22 | 5,396,952 | 22 |
| වාණිජ හා කළමනාකරණ | 1,896,404 | 10 | 2,104,441 | 11 | 2,695,744 | 11 |
| විද්‍යා | 3,774,005 | 21 | 4,091,338 | 21 | 4,893,040 | 20 |
| වෛද්‍ය | 3,322,362 | 18 | 3,512,116 | 18 | 4,193,628 | 17 |
| ඉංජිනේරු | 2,087,467 | 12 | 2,370,864 | 12 | 2,956,692 | 12 |
| කෘෂිකර්ම | 1,432,241 | 08 | 1,597,041 | 08 | 1,869,154 | 07 |
| තාක්ෂණ | 81,360 | 0.45 | 292,874 | 01 | 613,914 | 03 |
| සම සෞඛ්‍ය | 269,091 | 01 | 287,864 | 01 | 420,846 | 02 |
| අනෙකුත් පීඨ | 1,049,872 | 06 | 1,146,096 | 06 | 1,342,253 | 06 |
| | 18,124,430 | | 19,900,229 | | 24,382,223 | |

**මූලාශ්‍රය - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සංඛ්‍යා ලේඛන**


## (ඇ) සේවා වියුක්ති මට්ටම

විවිධ විෂය ධාරාවන් ඔස්සේ උපාධි හදාරා සේවා නියුක්ත වීමේදී තමන් හදාරන ලද විෂය ධාරාව බොහෝ දුරට සේවා වියුක්තිය පිළිබඳ ගැටලුවට බලපා ඇති බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016/2017 වර්ෂ වලදී සිදු කරන ලද සමීක්ෂණයකදී අනාවරණය කරගෙන ඇත. ඒ අනුව කලා උපාධිධාරීන්ගේ සේවා වියුක්තිය සියයට 50 ඉක්මවා තිබීම විශේෂිත කාරණයකි.

**උපාධිධාරීන්ගේ සේවා වියුක්තිභාවය**

| උපාධිය හැදෑරූ විෂය ධාරාව | සේවා වියුක්ති මට්ටම % |
|---|---|
| ගෘහ නිර්මාණ ශිල්පය | නැත |
| පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ | නැත |
| අධ්‍යාපන | නැත |
| සෞඛ්‍ය | 4.3 |
| ඉංජිනේරු | 7.8 |
| නීතිය | 14.3 |
| විද්‍යාව | 17 |
| කෘෂිකර්මය | 17.3 |
| කළමනාකරණය | 28.1 |
| කලා | 54.4 |
| ප්‍රසංග කලා | 62.8 |

**මූලාශ්‍රය - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2016-2017 වර්ෂ වලදී සිදු කරන ලද උපාධිධාරීන් පිළිබඳ අන්වේක්ෂණ අධ්‍යයන වාර්තාව**




## 2.2 විගණනය සඳහා අධිකාරි බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3(1)(ඈ), 5(2), 12(ඏ) වගන්ති අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 2.3 විගණන ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තිය සියයට 4.3 ක් වන අතර ඉන් ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස අ.පො.ස. (උ.පෙළ) හා ඊට ඉහළ සුදුසුකම් ලැබූ ප්‍රතිශතය 9.1 ක් වේ. සේවා වියුක්තිභාවය උපාධිය හැදෑරූ අධ්‍යයන විෂය ධාරාව අනුව සලකා බැලීමේ දී විද්‍යා, ඉංජිනේරු, කළමනාකරණ විෂය ධාරාවන් සම්බන්ධයෙන් රැකියා වියුක්තිභාවය පිළිවෙළින් සියයට27, සියයට 8 හා සියයට 29 වැනි අගයක් ගෙන තිබුණ ද කලා විෂය ධාරාව සම්බන්ධයෙන් එම අගය සියයට 54 ක් වැනි ඉහළ මට්ටමක පැවතුණි. ඵලදායී කුසලතාවයන් පවතින මානව සම්පතක් සංවර්ධනය සඳහා පාසල් හා විශ්වවිද්‍යාල මගින් ඉහළ මෙහෙවරක් සිදුකරනු ලබන අතර ඒ පිළිබඳ සැලකිල්ලට ගත්විට සෑම රජයක් විසින්ම ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් විශාල මූල්‍ය ආයෝජනයක් වාර්ෂිකව පාසල් හා විශ්වවිද්‍යාල පද්ධතිය හරහා වැය කරනු ලබයි. විශ්ව විද්‍යාල විශේෂයෙන් සළකා බැලීමේදී 2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම, විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන සඳහා කරන ලද වියදම රු.මිලියන 59,517 ක් විය.

මේ අනුව බිහි කරනු ලබන කලා උපාධිධාරීන් ප්‍රතිශතය අනුව එය ඉහල අගයක් බැවින් රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ පවත්වා ගෙන යනු ලබන උපාධි පාඨමාලාවලින් කලා උපාධිය වෙන්ව ගෙන සලකා බැලීමේදී වර්තමාන රැකියා වෙළඳපලේ ඉල්ලුමට නොගැළපීම හේතුවෙන් ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දීම හා ඌන සේවා නියුක්ත තත්ත්ව වලට පත්වීමට හේතුවී ඇත. මෙසේ ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා දායකත්වයක් ලබාදිය හැකි උගත් පිරිසක් සේවා වියුක්ත වීම හා ඒ සමගාමීව වෙනත් සමාජීය ප්‍රශ්න රාශියක් උද්ගතවන බවට විවිධ මාධ්‍ය මගින් නිරන්තරයෙන් වාර්තාවීම මෙම මාතෘකාව යටතේ කාර්යසාධන විගණනයක් තෝරාගැනීමට හේතු විය.

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 වර්ෂයේ සිදුකළ පර්යේෂණ වාර්තාවක සඳහන් පරිදි 2016, 2017 සහ 2018 වර්ෂවල කලා උපාධිය සම්පූර්ණ කළ උපාධිධාරීන් සම්බන්ධයෙන් මෙම තත්ත්වය පහත පරිදි වේ.

| වර්ෂය | රැකියා නියුක්තිභාවය (සියයට) |
|---|---|
| 2016 | 52.1 |
| 2017 | 20.9 |
| 2018 | 12.2 |

## 2.4 විගණන ක්‍රමවේදය

පහත සඳහන් විගණන ප්‍රවේශයන් වෙත යොමුවන ලදි.

i. තෘතීක අධ්‍යාපනය පිළිබඳ තොරතුරු විශ්ලේෂණය
ii. අදාළ ප්‍රතිපත්තීන්, අණ පනත්, ව්‍යාපෘති වාර්තා, පර්යේෂණ වාර්තා පරිශීලනය.
iii. විශ්ව විද්‍යාලවල කලා මාධ්‍යය උපාධිය අපේක්ෂකයින්ගෙන් ප්‍රශ්නාවලි මඟින් තොරතුරු ලබා ගැනීම.
iv. විශ්ව විද්‍යාල වල කලා මාධ්‍යය උපාධිය අපේක්ෂකයින්ගෙන් හා අධ්‍යයන කාර්ය මණ්ඩල වලින් සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගැනීම.
v. රැකියා විරහිත උපාධිධාරී සංගමයේ නියෝජනයක් මඟින් අදහස් ලබා ගැනීම.

## 2.5 විගණන අරමුණු හා නිර්නායක

### ප්‍රධාන විගණන අරමුණු

පාසල් මට්ටමින් හා විශ්වවිද්‍යාල මට්ටමින් කලා අංශයෙන් ලබාදෙන ලද අධ්‍යාපනය, රැකියා වෙළඳපොළ හා සමාජ ප්‍රගමනය කෙරෙහි දායකත්වයක් ලබාදෙන්නේද යන්න ඇගයීම.

| උප විගණන අරමුණු | විගණන නිර්නායක |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකාවේ අනාගත ගමන් මාර්ගය ගොඩනැගීමට උදෙසා වැඩදායී පුරවැසියකු බිහි කිරීම සඳහා පාසල් අධ්‍යාපනයෙන් සිදු කෙරෙන කාර්යභාරය ඇගයීම | (i) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුව ප්‍රකාශයට පත්කළ යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා<br>(ii) අධ්‍යාපන අමාත්‍යාංශයේ ආංශික සංවර්ධන වැඩසටහනේ (ESDP) ව්‍යාපෘති අරමුණු හා ක්‍රියාත්මක කිරීමේ සැලසුම්<br>(iii) අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය අනුගමනය කරනු ලබන උපාය මාර්ගික ක්‍රමවේද<br>(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විතීයික පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහය<br>(v) අධ්‍යාපන ක්ෂේත්‍රයේ පැවතිය යුතු මානව හා භෞතික පහසුකම්වල අපේක්ෂිත ඉලක්ක<br>(vi) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016/2017 වර්ෂ වල උපාධිධාරීන් සම්බන්ධව සිදුකළ අන්වේක්ෂණ සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇති නිර්දේශ<br>(vii) තරුණයන් පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ දක්වා ඇති නිර්දේශ |

| | | |
|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාලවල කලා උපාධි පාඨමාලා කාලීනව සංශෝධනය වන්නේද යන්න ඇගයීම. | (i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දැක්ම මෙහෙවර අරමුණු .<br>(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව<br>(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016/2017 වර්ෂ වල උපාධිධාරීන් සම්බන්ධව සිදුකළ අන්වේක්ෂණ සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇති නිර්දේශ |
| (ඇ) | කලා උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය සම්බන්ධයෙන් රාජ්‍ය යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය ඇගයීම. | (i) ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, කාර්යභාර්ය.<br>(ii) තරුණයන් පිළිබඳ කොමිෂන් සභා වාර්තාව<br>(iii) මිනිස් බල සැලසුම් ප්‍රතිපත්තිය |

## 2.6 විගණන විෂය පථය

(අ) කලාව වනාහි පුද්ගල අධ්‍යාත්මය තුලනය කරන මෙවලමක් වන්නා සේම ඒ තුළින් සමාජය යහපත් සංවේදී හා ගුණාත්මක බවකින් යුතු ස්ථානයක් බවට පත්කරවන බව අවිවාදිතය. එසේම කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදීමේ එකම පරමාර්ථය රැකියා බිහිකිරීමද නොවේ. සමාජයක ගුණාත්මක වර්ධනයක් සඳහා මානව රසාස්වාදය හා සංවේදී චින්තනයක් සහිත මිනිසුන් බිහිවිය යුතුය. ඒ සඳහා කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරූ සාහිත්‍ය ගුරුවරුන්, ලේඛකයන්, චිත්‍ර ශිල්පීන්, සංගීතඥයින්, නාට්‍යකරුවන්, රංගන ශිල්පීන් ආදි වශයෙන් වෘත්තිකයන් හා වෘත්තිකයන් නොවන ස්වේච්ඡාවෙන් සේවා වියුක්ත පිරිස්ද සිටිය යුතුය. නමුත් 2019 ලෝක බැංකු දර්ශක අනුව ශ්‍රී ලංකාව ආර්ථික වර්ධන වේගය සියයට 2.77 තරම් පහළ අගයක සිටින රටක් වශයෙන් ඉන් නැගී සිටීම සඳහා සමස්ත අධ්‍යාපන ප්‍රතිපත්ති රැකියා සංවේද විය යුතු සේම අධ්‍යාපනය ආර්ථික සංවර්ධනය කරා යොමු විය යුතුය යන ප්‍රවේශය මූලික කර ගැනුණි.

(ආ) ඒ අනුව කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සියලු සිසුන් මෙන්ම සියලු කලා උපාධිධාරීන් රැකියා ගත විය යුතුය යන සංකල්පයෙන් බැහැර වී බහුතරයක් රටේ රැකියා විරහිතභාවයෙන් මිදී ආර්ථික සංවර්ධනය උදෙසා දායක විය යුතුය යන උපකල්පනයේ සිටිමින් සිදුකල මෙම විගණනයේ විෂය පථය අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල ලැබීමෙන් පසු ශිෂ්‍යයකු කලා විෂය ධාරාව තෝරාගැනීමේ සිට මෙරට විශ්වවිද්‍යාලයකින් කලා පීඨයේ ප්‍රථම උපාධිය ලබා රැකියාගතවීම තෙක් අදියරයන් ඉලක්ක කරමින් අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳව සලකන ලදි.

(ඇ) මෙහිදී ලංකාවේ පළාත් හා ජාතික පාසල්වල මෙන්ම රාජ්‍ය විශ්වවිද්‍යාල වල පවත්වාගෙන යනු ලබන කලා විෂය ධාරාව පමණක් අවධානයට ලක්කරන ලදි.

(ඈ) කලා උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය කෙරෙහි පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින් ඇතිකරන බලපෑමට පරිබාහිරව ඇතිකරන අනෙකුත් සාධක මෙහිදී සැලකිල්ලට භාජනය නොවුණි.

(ඉ) කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරා ඌන සේවා නියුක්තියට පත්ව ඇති පිරිස පිළිබඳව මෙහිදී සාකච්ඡා නොකෙරේ.

(ඊ) රැකියා විරහිත උපාධිධාරීන් පිළිබඳ නිවැරදි සංඛ්‍යානමය දත්ත පද්ධතියක් විගණන අවස්ථාව වන විට නොතිබුණි. රැකියා විරහිත උපාධිධාරී සංගමයේ අදහස් හා යෝජනා ලබා ගත්තද සමස්ථයක් ලෙස නිවැරදි සංඛ්‍යානමය දත්ත ලබා ගැනීමට නොහැකි වීම හා මෙම ගැටලුව පිළිබඳ සිදුකළ වෙනත් පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොවූයෙන් විගණන නිරීක්ෂණ ගොඩනැගීමේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2016/2017 වසර වලදී උපාධිධාරීන් පිළිබඳව සිදුකළ අන්වේක්ෂණ අධ්‍යයන වාර්තාව පදනම් කර ගන්නා ලදී.

(උ) විගණන නිරීක්ෂණ ගොඩනැගීමේදී සමස්ථ විශ්ව විද්‍යාල පද්ධතියෙන්ම අවශ්‍ය දත්ත ලබා ගත්තද කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන සිසුන්ගේ අදහස් හා යෝජනා විමසීමේදී කැලණිය හා ජයවර්ධනපුර විශ්ව විද්‍යාල දෙක පමණක් තෝරා ගන්නා ලදී.

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 අධ්‍යාපන ප්‍රතිපත්ති

#### 3.1.1 අධ්‍යාපන ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම (පාසල් සාමාන්‍ය අධ්‍යාපන අංශ සඳහා)

තරුණයන්ගේ අසහනය, අදාන්ත බව හා අසහනය ඇති වීමට තුඩු දී ඇති හේතු පිරික්සා බලා තරුණයන්ගේ එම ආකල්ප, හැසිරීම් හා පැවතුම් අධෛර්යයට පත් කිරීමට ප්‍රමාණවත් වන ආකාරයේ පිළියම් වශයෙන් ගත යුතු පියවරවල් නිර්දේශ කිරීමට පත් කරන ලද තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ (1990 මාර්තු මස එළිදැක්වන ලද) දක්වා ඇත්තේ අධ්‍යාපනය ආර්ථික සංවර්ධනය කරා යොමුවිය යුතු බවත්, ලංකාව මුහුණ පාන ප්‍රධාන ගැටළුවලින් එකක් වී ඇත්තේ අධ්‍යාපන හා රැකියා නියුක්තිය අතර නොගැලපීමක් පවතින බවත්ය. එසේම එවකට මෙම කොමිෂමට නිරන්තරයෙන් ලැබුණු පැමිණිලි අතර ශිෂ්‍යයන්ගේ බලාපොරොත්තු නැති කිරීමට හේතුවන පරිදි අදාළ බලධාරීන් විසින් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අඛණ්ඩතාවක් නොමැති බව දක්වා ඇත.
ඒ අනුව අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික කොමිෂමක් පිහිටුවීමේ දැඩි අවශ්‍යතාවයක්ද ඒ මගින් වහාම දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයද මෙම කොමිෂම මතු කර ඇත. විස්තර පහත දැක්වේ.

(අ) 1991 අප්‍රේල් 19 දිනැති 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සිදු කරන ලද අධ්‍යයන පදනම් කරගෙන 1992, 2003 හා 2016 වර්ෂවල සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා විස්තරාත්මකව සකස් කර මුද්‍රණය කර අතිගරු ජනාධිපතිතුමා වෙත පිලිගන්වා ඇති නමුත්, ඒවා අමාත්‍ය මණ්ඩලය හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කර ප්‍රතිපත්ති ලෙස ප්‍රකාශයට පත් කිරීම සිදු වී නොමැත.
එසේ වුවත්, මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි සඳහන් ඇතැම් යෝජනාවන් විෂයමාලා ප්‍රතිසංස්කරණයන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවා තිබුණද, සමස්ථයක් ලෙස ගත්විට 2020 මැයි මාසය වන විටත් පිලිගත් අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත්වීමකින් තොරව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) තරුණයන් පිළිබඳ මෙම ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යාපනයේ එකම පරමාර්ථය රැකියා බිහිකිරීම ලෙස කොමිෂම විශ්වාස නොකළත් අධ්‍යාපන ප්‍රතිපත්ති රැකියා සංවේදී විය යුතු බවත්, ඵලදායි අධ්‍යාපන සැලසුම් කිරීමක් මඟින් ආර්ථිකයේ ඉල්ලුම පිළිබඳ පාර්ශවය ආරක්ෂා කළ යුතු බවත් දක්වා ඇත.

නමුත් 1997 න් පසු වර්ෂ 22 ක් ඉකුත්ව ගොස් තිබුණද, වර්තමාන ආර්ථිකයේ රැකියා ඉල්ලුමට සරිලන සාමාන්‍ය අධ්‍යයන ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබීම බරපතල කරුණක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) මෙම කොමිෂන් වාර්තාවේ දක්වා ඇති පරිදි මෙරට තරුණ අසහනයට මූලික හේතුව අධ්‍යාපනය හා රැකියා අතර නොගැලපීම බව තහවුරු කර ඇත. අධ්‍යාපන ක්‍රමයක් සම්පූර්ණයෙන්ම රැකියා නිර්මාණ කෙරෙහි යොමුවිය යුතු බව මෙම කොමිසම අදහස් නොකළද ශාස්ත්‍රීය නොවන ප්‍රායෝගික පුහුණුවක් ශිෂ්‍යයන්ට ලැබෙන පරිදි වෘත්තීය හා පුහුණු අංශය වැඩි දියුණු කිරීම තුළින් සිසුන්ට පෞද්ගලික අංශයේ රැකියාවකට යොමු වීම හෝ ස්වයං රැකියාවල යෙදීමට හැකිවනු ඇති බවට කොමිෂම වාර්තා කර තිබුණි.

### 3.1.2 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සංශෝධන

1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1), 2(3) හා (8i) අ, ආ සහ ඇ වගන්ති වලින් ලද විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා 2003 හා 2016 දී ප්‍රතිපත්ති යෝජනා සකස් කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 විගණන දින වන විටද එකී යෝජනා ක්‍රියාත්මක කිරීමේ ආයතනික හා නෛතික පරිසරය සකස් වී නොතිබුණි. නමුත් යම් දුරකට පහත දැක්වෙන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ වැඩසටහන් පාසල් මට්ටමින් ගෙන ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ED/05/84/06/01/32 අංක දරන හා 2020 පෙබරවාරි 14 දිනැති ලිපියෙන් දක්වා තිබුණි. ඒ අනුව සමස්ථ ලාංකික සිසු ප්‍රජාවට මෙම කාලීන ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් උදාවන යහපත් ප්‍රතිඵල භුක්ති විඳීමේ අවස්ථාව අහිමි වී ගොස් ඇත.

(අ) සංකීර්ණ නූතන සමාජය තුළ සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය මෘදු කුසලතා පෞරුෂ වර්ධනය සඳහා ක්‍රියාමාර්ග ආදිය විෂය මාලාවට යොමුවිය යුතු බව.

(ආ) පාසල් අධ්‍යාපනයේ කණිෂ්ඨ ද්විතියික අවධියේදී සිසුන්ට ලෝකයට පෙළ ගැසීමට අවශ්‍ය විෂයන් අතර තාක්ෂණවේදය අනිවාර්යය විෂයක් බවට පත්කල යුතු බව හා ප්‍රායෝගික වැඩ, ව්‍යාපෘති ගැන උනන්දු කළ යුතු බව.

(ඇ) ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධියේදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් පසු සියයට 10 ට වැඩි ප්‍රතිශතයක් පාසලෙන් ඉවත්වන බැවින් ඔවුන්ද, රටේ ශ්‍රම බලකායට එකතුවීම සඳහා වඩාත් වාසිදායක හා පුහුණුවීම් ක්ෂේත්‍රවලට යොමුවිය යුතු බව හා මෙම පිරිස සඳහා වඩාත් හොඳ ස්ථාවරයක් ලබාදීම පිණිස වැඩ ලෝකය කෙරෙහි සම්බන්ධයක් තිබිය යුතු වෛකල්පිත විෂයයන් හඳුන්වා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරමින් පවතින 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන දිවයින පුරා ඇති පාසැල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයිය යුතු බව.

(ඈ) දෙවන භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා අ.පො.(සා.පෙළ) විභාගය සම්පූර්ණ කරන තුරු දෙවන භාෂාව ඉගෙන ගැනීම දිගටම කරගෙන යන ලෙස අනිවාර්යය කිරීම.

### 3.1.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ සූදානම

ජාතික අධ්‍යාපන හා ප්‍රතිපත්ති රාමුව තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ජාතික පොදු අරමුණු ඉටුකර ගැනීම උදෙසා වෙනස් වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.

පාසල් සිසුන් උසස් පෙළ සඳහා කලා විෂයධාරාව තෝරාගැනීමේ සිට රැකියාගත වීම තෙක් වන දත්ත පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි 2017 වර්ෂයේදී උසස් පෙළ කලා විෂය ධාරාව යටතේ පෙනී සිටි සිසුන්ගෙන් සියයට 10 ක් පමණක් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන බවත්, එම පිරිසෙන් සේවා නියුක්ති ප්‍රමාණය සියයට 46 ක් පමණක් විය. ඒ අනුව කලා විෂය ධාරාවන් හදාරා ශ්‍රම බලකායට එකතු වන පිරිස පිළිබඳ විස්තර පහත ධාරා සටහනේ දැක්වේ.

අ. පො. ස. උසස් පෙළ කලා විෂය ධාරාවට පෙනී සිටි සිසුන් ගණන - **97,682**

විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ප්‍රමාණය - **68,534**

විශ්ව විද්‍යාල ප්‍රවේශය ලද සිසුන් ගණන - **9,923**

රැකියා නියුක්ති වන පිරිස - **4,565**

**කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරා (සේවා නියුක්ත උපාධිධාරීන් හැරුණු පසු) රැකියා අපේක්ෂාවෙන් ශ්‍රම බලකායට එකතුවන පිරිස ආසන්න වශයෙන් 93117**

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දත්ත හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2016/2017 වර්ෂයේදී උපාධිධාරීන් පිළිබඳ සිදුකළ අන්වේක්ෂණ අධ්‍යයන වාර්තාවේ දත්ත**

එසේම අධ්‍යාපනයේ අරමුණ විය යුත්තේ විනයගරුක සමාජයක් බිහි කිරීම හා නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය සාර්ථක වෘත්තිකයන් පිරිසක් බිහි කිරීමයි.රැකියා වෙළඳපොල හා අධ්‍යාපනය අතර සම්බන්ධයක් නොතිබීම හේතුවෙන් අධ්‍යාපනය එක් පැත්තකට සහ රැකියා වෙළඳපොලෙහි ඇබෑර්තු වෙනත් පැත්තක් වෙත යොමු වී තිබුණි. දියුණු රටවල් වෘත්තීය කුසලතා සහිත පුද්ගලයන් නිර්මාණය කිරීම සඳහා අධ්‍යාපනය යොදා ගත් අතර ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය පුද්ගලයන් බිහි කිරීමට අධ්‍යාපනය යොදා ගත්තේය.

ලංකාවේ සියලු පලාත් අතරත්, ග්‍රාමීය හා නාගරික වශයෙනුත් සියලු පළාත් අතර ඇති පාසල්වල භෞතික හා මානව සම්පත් සමානව බෙදීයන අයුරින් ලබාදීමේ වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.


13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අධ්‍යාපනය පළාත් විෂයක් ලෙස විමධ්‍යගත වුවද දිවයිනේ සමස්ත පාසල් ව්‍යුහය තුළ සම්පත් බෙදීයාම නියාමනය කිරීමේ හා ඒ සඳහා ප්‍රමිති පවත්වා ගෙන යාමේ කාර්යය අධ්‍යාපන අමාත්‍යාංශය සතු මූලික වගකීමක් වේ. නමුත් මෙම වගකීම නිසි පරිදි ඉටු වීම පිළිබඳ ප්‍රශ්නකාරී තත්ත්වයක් රටතුළ පවතී.

ඒ අනුව වෙනස් වන ලෝකයට සරිලන සේ උසස් පෙළ විෂය ධාරාව විශේෂයෙන් කලා විෂය ධාරාව සංශෝධනය කිරීම හා සාපේක්ෂ වශයෙන් කලා විෂය ධාරාව ඉගෙනීමට නැඹුරුවන සිසු පිරිස වැඩිවීම තුළ එය පාලනය ක්‍රමානුකූලව අවම කිරීමේ වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

### 3.1.3.1 කලා විෂය ධාරාවන් තෝරා ගැනීම (උසස් පෙළ සඳහා)

(අ) පාසල් ළමුන් අ. පො. ස. (උ/පෙළ) සඳහා විෂය ධාරාවන් තෝරා ගැනීම පිළිබඳ පසුගිය වර්ෂ 07 දත්ත පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ 2015 වසරින් පසු කලා විෂය ධාරාව තෝරා ගැනීමේ වැඩි ප්‍රවණතාවයක් පැවතීමයි. තවද කලා විෂය ධාරාව ඇතුලු විෂය ධාරාවන් 04 ක් යටතේ 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අදාළ විෂය ධාරාවන් තෝරා ගැනීම පිළිබඳ විස්තර වලට අනුව විද්‍යා විෂය ධාරාව තෝරා ගැනීම පිළිවෙලින් සියයට 23 සිට සියයට 24 දක්වා වර්ධනයක් පවතින බවද වාණිජ විෂය ධාරාව තෝරා ගැනීම සියයට 30 සිට සියයට 20 දක්වා අඩු වීමක්ද තාක්ෂණවේදය විෂය ධාරාව තෝරා ගැනීම සියයට 8 සිට සියයට 12 දක්වා වර්ධනයක්ද කලා විෂය තෝරා ගැනීම එම කාලසීමාව තුළ සියයට 42 සිට සියයට 45 දක්වා වූ දැඩි වෙනසකට ලක් නොවූ පරාසයක් තුළ පවතින බවද නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මුලු සිසුන් ගණන | විද්‍යාව | ප්‍රතිශතය | වාණිජ | ප්‍රතිශතය | තාක්ෂණවේදය | ප්‍රතිශතය | කලා | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ------- | --------- | -------- | ------- | -------- | --------- | ---------------- | --------- | ------- | -------- |
| | | | % | | % | | % | | % |
| 2012 | 160,580 | 37,588 | 23 | 48,593 | 30 | - | - | 74,399 | 46 |
| 2013 | 162,338 | 36,637 | 23 | 40,430 | 25 | 13,452 | 8 | 71,819 | 44 |
| 2014 | 156,332 | 37,853 | 24 | 37,774 | 24 | 13,253 | 8 | 67,452 | 43 |
| 2015 | 159,677 | 39,118 | 24 | 37,234 | 23 | 17,279 | 11 | 66,346 | 42 |
| 2016 | 164,732 | 35,570 | 22 | 38,656 | 23 | 17,955 | 11 | 72,551 | 44 |
| 2017 | 171,160 | 36,482 | 21 | 38,116 | 22 | 18,800 | 11 | 77,762 | 45 |
| 2018 | 198,439 | 46,654 | 24 | 39,114 | 20 | 23,593 | 12 | 89,078 | 45 |




**මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය**

ඉහත තොරතුරු හා දත්ත අනුව පහත කරුණු ගම්‍යමාන වේ.

(i) වාණිජ විෂය ධාරාව තෝරා ගැනීම ක්‍රමයෙන් අවම වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබීම.

(ii) 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී විද්‍යා අංශයෙන් උසස් පෙළ හැදෑරීමේ ප්‍රවණතාවයක් පැවතීම.

(iii) තාක්ෂණවේදය විෂය ධාරාව ආරම්භ කරන ලද්දේ 2013 වර්ෂයේදී වන අතර, ඒ සඳහා සිසුන් නැඹුරුවීමේ හොඳ ප්‍රවණතාවක් පවතින බව.

(iv) 2014, 2015 වර්ෂයන්හිදී කලා විෂය ධාරාවන්ට යොමුවීමේ යම් පසුගාමී තත්ත්වයක් දක්නට තිබුණද, 2018 වර්ෂය වන විට වැඩි වර්ධන වේගයකින් සිසුන් ඒ සඳහා යොමුවන බව.

(ආ) ලංකාවේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් හා පළාත් පාසැල් හා ජාතික පාසැල්වල විදුහල්පතිවරුන් වෙතින් ලද තොරතුරු අනුව සිසුන් විද්‍යා හා ගණිත, වාණිජ හා තාක්ෂණ විද්‍යා විෂය ධාරාවන් සඳහා යොමුවනවාට වඩා වැඩි ප්‍රතිශතයක් කලා විෂය ධාරාව යොමුවීමට හේතු වශයෙන් පහත කරුණු ඉදිරිපත් විය.

i. කලා විෂය ධාරාව හැදෑරීමට ළමුන්ට ඇති කැමැත්ත මත

ii. විද්‍යා, ගණිත, වාණිජ විෂය ධාරාවන් සඳහා ගණිත දැනුම පදනම් කරගෙන විභාග වලට පෙනී සිටීමට සිදුවන බැවින්, ගණිත විෂයට අඩු සමාර්ථ ලැබූ සිසුන් කලා විෂය ධාරාව තෝරාගැනීමට හේතුවේ.

iii. තාක්ෂණ විෂය හැදෑරීම සඳහා සිසුන් තුළ දැඩි කැමැත්තක් තිබුණද, තාක්ෂණික විද්‍යාගාර පහසුකම් නොමැතිවීම හා පුහුණු ගුරුවරුන් නොමැතිවීම.

iv. පාසැල්වල වෙනත් විෂය ධාරාවන් කිරීමට තරම් අ.පො.ස.(සා.පෙ.) ප්‍රතිඵල ප්‍රමාණවත් නොවීම හා ඉහළ ප්‍රතිඵල ලැබූ සිසුන්ට ජනප්‍රිය පාසැල්වල විද්‍යා ගණිත විෂයන් ධාරාවන් සඳහා බාහිර පාසැල්වල ළමුන් ඇතුළත් කිරීමට පන්ති කාමරවල ඉඩකඩ සීමිත වීම.

v. පවුලේ අඩු ආදායම් තත්ත්වය හා බාහිර පන්තිවලට යෑමට ආර්ථික ශක්තිය නොමැතිවීම.

vi. ගණිත හා විද්‍යා විෂයයන්ට සම්මාන සාමාර්ථ නොමැතිවීම හා අ.පො.ස.(සා.පෙ.) ප්‍රතිඵල මත වෙනත් විෂය ධාරාවකට යොමුවීමට ඇති අවකාශය අවම වීම.

vii. තමාට උසස්පෙළ විභාගයේදී පහසුවෙන් සමත් කරගත හැකි විෂයයන් කලා විෂය ධාරාවන් තුළ ඇතුළත්ව ඇති නිසා මෙම විෂය ධාරාව තෝරා ගැනීමට හේතුවේ.

viii. පළමුවරට විශ්වවිද්‍යාල ප්‍රවේශයට යෑමට පහසු විෂය ධාරාවක් වීම හා ජනප්‍රිය හා පාසැල් වලට යාමට ඇති දුෂ්කරතාවය නිසා කලා විෂය ධාරාව තෝරා ගැනීමට හේතුවේ.

ix. කලා විෂය ධාරාව තෝරා ගැනීම තුළින් පරිපාලන, නීති හා ඉහළ විධායක තනතුරු වලට යොමුවීමට ඇති කැමැත්ත හා වෙනත් විෂය ධාරාවන්ට සාපේක්ෂ කලා විෂය ධාරාව හැදෑරීමට ඇති භෞතික හා මානව සම්පත් සුලභ වීම හා විද්‍යා හා ගණිත වැනි විෂය ධාරාවන් කෙරෙහි කැප කිරීමක් කිරීමට ඇති අකමැත්ත.

x. තාක්ෂණවේදය විෂයන් කිරීමට සිසුන් විශාල ප්‍රමාණයක් සිටින පාසැල්වල පුහුණු ගුරුවරුන් හා විද්‍යාගාර පහසුකම් නොමැතිවීම නිසා තාක්ෂණික විද්‍යාගාර පහසුකම් ඉදිකිරීම් කටයුතු, අනුමත වී තිබුණද, ආරම්භ කර නොමැති වීම නිසා කලා විෂය ධාරාවනට යොමුවීමට හේතුවේ.
(උදා: නු./ යහපත් එඬේරා බා.ම.වි.නුවරඑළිය)

xi. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කල පැහැදිලි කිරීම් අනුව අ.පො.ස.(උ/පෙළ) කලා විෂය ධාරාව සඳහා සිසුන් වැඩිපුරම යෙදවීමට හේතුවන්නේ බොහෝ ගම්බද හා වතු ආශ්‍රිත ප්‍රදේශවල ඇත්තේ කලා විෂය ධාරාව සහිත පාසල්වීමත්, විද්‍යා විෂය ධාරාව තුළ සිසුන් බොහෝ විට පෞද්ගලික පන්ති කරා යොමුවීමේ ප්‍රවණතාවය වැඩිවන අතර, ඒ සඳහා මැදි ආදායම් සහ පහළ ආදායම් සහිත දෙමාපියන් හට වියදම් දැරීමේ අපහසුතා පැවතීමත් හේතුවන බවයි.


(ඇ) ජාතික පාසැල්වල කලා විෂය ධාරාවන්ට යොමුවීමේ අඩු ප්‍රමාණයක් නිරීක්ෂණය වන අතර කලා විෂය ධාරාවෙන් උසස්පෙළ පෙනී සිටීමේදී අනාගත රැකියා වෙළඳපොල හා රැකියා අවස්ථා පදනම් කරගත් විෂයක් නොවීම නිසා, කලා විෂය ධාරාව තෝරා ගැනීමේ අඩුවක් දක්නට ලැබෙන බව මහනුවර උසස් බාලිකා විදුහලේ විදුහල්පති විසින් දක්වා ඇත.

### 3.1.3.2 පළාත් අනුව උසස් පෙළ විෂය ධාරාවන් තෝරා ගැනීම

ලංකාවේ ඇතැම් පළාත්වල සිසුන් උසස් පෙළ විෂය ධාරාවන් තෝරාගැනීමේදී විද්‍යා, ගණිත වාණිජ ආදී විෂය ක්ෂේත්‍ර තෝරා නොගෙන කලා මාධ්‍යයෙන් උසස් පෙළ හැදෑරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූයේ පළාත් 9 න් බස්නාහිර පළාතේ 2017, 2018 වර්ෂවල කලා විෂය තෝරා ගැනීමේ ප්‍රමාණය සියයට 20 සිට සියයට 35 දක්වා වර්ධනය වී ඇති අතර, දකුණ, මධ්‍යම, සබරගමුව යන පළාත්වල මෙය සියයට 49 ට වඩා අඩු ප්‍රතිශතයක (42% සිට 49% ක් දක්වා) පවතින අතර, වයඹ, උතුර, උතුරු මැද, ඌව, නැගෙනහිර යන පළාත්වල මෙය සියයට 50 සිට සියයට 53 දක්වා වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඒ අනුව පළාත් අනුව උසස් පෙළ විෂය ධාරාවන් තෝරා ගැනීම හා දරිද්‍රතා මට්ටම අතර මෙහිදී සහසම්බන්ධයක් පැවැති බව නිරීක්ෂණය විය.

| පළාත | වර්ෂය | උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි විෂය ධාරාව | | | | | කලා විෂය ධාරාව තෝරා ගැනීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|
| | | ගණිතය | විද්‍යාව | වාණිජ | තාක්ෂණ වේදය | කලා | |
| බස්නාහිර | 2017 | 4362 | 3862 | 12003 | 33592 | 14125 | 20 |
| | 2018 | 7101 | 5506 | 13991 | 5230 | 17297 | 35 |
| වයඹ | 2017 | 2111 | 1907 | 4032 | 2636 | 10606 | 50 |
| | 2018 | 2824 | 2582 | 3811 | 2950 | 12178 | 50 |
| දකුණ | 2017 | 3646 | 3049 | 4731 | 2298 | 10157 | 42 |
| | 2018 | 4027 | 3331 | 4589 | 3166 | 10717 | 41 |
| මධ්‍යම | 2017 | 1948 | 2375 | 4992 | 2671 | 10868 | 48 |
| | 2018 | 2226 | 2965 | 4804 | 2956 | 12596 | 49 |
| සබරගමුව | 2017 | 1577 | 1945 | 3337 | 2130 | 7526 | 41 |
| | 2018 | 1890 | 2556 | 3395 | 2684 | 8725 | 45 |
| උතුර | 2017 | 1349 | 1201 | 1886 | 915 | 5688 | 52 |
| | 2018 | 1432 | 1472 | 1558 | 1027 | 6158 | 53 |
| උතුරු මැද | 2017 | 1012 | 1225 | 2439 | 1341 | 6174 | 51 |
| | 2018 | 1054 | 1486 | 2305 | 1847 | 6466 | 49 |
| ඌව | 2017 | 879 | 1152 | 2269 | 1304 | 5715 | 50 |
| | 2018 | 1271 | 1418 | 2259 | 1760 | 6622 | 50 |
| නැගෙනහිර | 2017 | 1278 | 1604 | 2427 | 1913 | 6903 | 49 |
| | 2018 | 1452 | 2021 | 2281 | 1980 | 8185 | 51 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**





### 3.1.3.3 දරිද්‍රතාවය හා අධ්‍යාපනයේ විෂමතාවය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා සම්බන්ධ ජනාධිපති කාර්යසාධන බලකායේ වාර්තාවට අනුව එක් එක් පළාත්වල හා දිස්ත්‍රික්කවල පාසල් සඳහා භෞතික අවශ්‍යතා හා සම්පත් සමානව සපයා නොමැති බවත්, අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වන අන්දම මෙවැනි විෂමතා මත රඳා පවතින බැවින් ඉගෙනීම ලබන ශිෂ්‍යයන්ගේ පසුබිම, ඔවුන්ගේ අධ්‍යාපනයේ සහභාගීත්වය, දක්ෂතා ප්‍රකාශ කිරීම, එලඹෙන අධ්‍යාපනික මට්ටම කෙරෙහි එම විෂමතා බොහෝ දුරට බලපාන බව දක්වා ඇත.

පහත දක්වා ඇති පරිදි මෙම පළාත්වල පාසල්වල සම්පත් ඌනතාවය මෙන්ම ළමුන්ගේ ජීවන මට්ටම තුළ ජීවන අවශ්‍යතා අවම මට්ටමක වුවද දරිද්‍රතාවය තුළින් පීඩා විඳින බව නිරීක්ෂණය වේ. මෙහිදී දරිද්‍රතා දර්ශකය ඉහළ අගයක් ගන්නා ඌව, සබරගමුව, නැගෙනහිර, උතුර වැනි පළාත්වල සිසුන් උසස් පෙළ සඳහා කලා විෂය ධාරාවන් තෝරා ගැනීමේ වැඩි ප්‍රවණතාවයක් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| පළාත | උසස් පෙළ ලියූ මුළු සිසුන් ගණන | 2017/2018 උසස්පෙළ කලා විෂය ධාරාව තෝරාගන්නා සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය | උසස් පෙළ විද්‍යා විෂය ධාරාව පවතින පාසල් (1AB) සංඛ්‍යාව | දරිද්‍රතා දර්ශකයන් (2016) | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ජනගහන දරිද්‍රතා දර්ශකයන් | දිළිඳු ගෘහ ඒකක ප්‍රතිශතය | අන්තර් දරිද්‍රතා දර්ශකය |
| ----------- | -------- | ---------------- | ---------- | ------------ | ----------- | ----------- | ---------- |
| බස්නාහිර | 65,672 | 19,268 | 29.34 | 207 | 1.7 | 1.2 | 0.3 |
| වයඹ | 28,396 | 12,161 | 42.83 | 106 | 2.7 | 2.1 | 0.4 |
| දකුණ | 36,474 | 13,561 | 37.18 | 149 | 3.0 | 2.3 | 0.4 |
| උතුරු මැද | 15,571 | 6,830 | 43.86 | 64 | 3.3 | 2.4 | 0.5 |
| මධ්‍යම | 32,151 | 13,021 | 40.5 | 114 | 5.4 | 4.1 | 0.9 |
| ඌව | 17,301 | 7,482 | 43.25 | 83 | 6.5 | 5.4 | 0.7 |
| සබරගමුව | 24,726 | 10,255 | 41.47 | 109 | 6.7 | 5.1 | 1.1 |
| නැගෙනහිර | 19,396 | 9,420 | 48.57 | 99 | 7.3 | 5.3 | 1.2 |
| උතුර | 13,643 | 5,684 | 41.66 | 104 | 7.7 | 6.3 | 1.1 |




**මූලාශ්‍රය -ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව -2019 ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යානය**

ඉහත දත්ත අනුව පෙනී යන්නේ ලංකාවේ දරිද්‍රතා මට්ටම වැඩි පලාත්වල සිසුන් වැඩි ප්‍රමාණයක් කලා විෂය ධාරාවට යොමුවන බවයි. බස්නාහිර පලාතේ ජනගහන දරිද්‍රතා දර්ශකය 1.7 ක් වැනි අඩු අගයක් පවතින විට කලා විෂය ධාරාව තෝරා ගන්නා සිසුන්ගේ ප්‍රතිශතය සියයට 29 ක් වැනි අවම මට්ටමක පවතී. එසේම ඌව, සබරගමුව, නැගෙනහිර, උතුරු පලාත්වල ජනගහන දර්ශක පිළිවෙලින් සියයට 6.5,6.7,7.3,7.7 ක් වන විට කලා විෂය ධාරාව තෝරා ගන්නා සිසුන් ප්‍රමාණය සියයට 43ක්, 42 ක්,49 ක්,42 ක් වැනි ඉහල අගයක්

ගන්නා බවද නිරීක්ෂණය වේ. එසේම ඌව, නැගෙනහිර වැනි දරිද්‍රතා මට්ටම ඉහල අගයක් පවතින පලාත් වල උසස් පෙළ විද්‍යා විෂය ධාරාව පවතින පාසල් සංඛ්‍යාව අඩු අගයක් ගන්නා බවද ඉහත දත්ත අනුව නිරීක්ෂණය විය.

විද්‍යා විෂය ධාරාවන් තෝරා ගැනීමේදී ඒ සඳහා අමතර ඉගැන්වීම් සිදුකිරීමට දෙමාපියන්ට ආර්ථික ශක්‍යතාවයක් නොමැතිවීම, විශේෂයෙන් මධ්‍යම පලාතේ තේ වතු ආශ්‍රිත රැකියා කරන දෙමාපියන්ට මේ තත්ත්වය බලපාන බව මේ සම්බන්ධව අදහස් දැක්වූ විදුහල්පතිවරුන් විගණනයට අදහස් දක්වා ඇත.

### 3.1.3.4 අ.පො.ස.(සා.පෙළ) විභාග තුල ඉංග්‍රිසි විෂයේ වැදගත්කම

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2016/2017 වර්ෂයේදී උපාධිධාරීන් පිළිබඳ සිදුකළ අන්වේක්ෂණ අධ්‍යයනයට අනුව තරඟකාරී ආර්ථික ව්‍යුහය තුළ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන අවශ්‍යතාවන් ඉටුකරගැනීමට හා වෘත්තීයමය වශයෙන් ස්ථාපිත වීමට ඉංග්‍රිසි භාෂාව අත්‍යාවශ්‍ය මෙවලමක් වේ. මේ සඳහා පාසැල් මට්ටමින් අධ්‍යාපන කඩඉම් සඳහා සිසුන්ට අවශ්‍ය ප්‍රවීණතාවය ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් විය යුතුය. නමුත් පසුගිය වර්ෂ කිහිපයක අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රිසි විෂය අසමත් වීමේ පිරිස 45% කට වඩා වැඩි බව නිරීක්ෂණය විය. විශ්වවිද්‍යාල වලින් පිටවන කලා උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවයට ඉංග්‍රිසි භාෂා දැනුම ප්‍රමාණාත්මක නොවීම පිළිබඳ කාරණයද බලපාන බැවින් මේ පිළිබඳව වැඩි අවධානය යොමුවිය යුතුය. පසුගිය වසර 3 තුල ඉංග්‍රීසී භාෂාව අසමත්වීමේ ප්‍රතිශතය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| වර්ෂය | අ.පො.ස.(සා.පෙළ) | | | | |
|---|---|---|---|---|---|
| | පෙනීසිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | අසමත් සංඛ්‍යාව | අසමත් ප්‍රතිශතය |
| 2016 | 285,686 | 136,851 | 47.9 | 148,835 | 52.1 |
| 2017 | 296,157 | 151,393 | 51.12 | 144,764 | 48.88 |
| 2018 | 295,744 | 162,366 | 54.9 | 133,378 | 45.10 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

### 3.1.3.5 අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රිසි විෂය

අ.පො.ස. උසස් පෙළ කලා විෂය ධාරාව යටතේ ඇති ඉංග්‍රිසි විෂය හදාරන ශිෂ්‍යයන්ගෙන් සමත් ප්‍රතිශතය 50% -60% ත් අතර ප්‍රමාණයක් විය. එසේම මෙම සිසුන්ගෙන් "A" සමාර්ථයක් ලබන පිරිසද 2015 වර්ෂයට සාපේක්ෂව අවම බව පෙනී යන හෙයින් රැකියා වෙළඳපල අරමුණු කරගත් අධ්‍යාපනය තුළ මෙම තත්ත්වය කෙරෙහි විශේෂ අවධානය යොමුකර නොමැති බව නිරීක්ෂණය වේ. විස්තර පහත පරිදි විය.

උසස් පෙළ ප්‍රතිඵල- ඉංග්‍රීසි විෂය

| වර්ෂය | පෙනී සිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | A සමාර්ථ ගත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2015 | 1,317 | 794 | 60% | 20 |
| 2016 | 1,350 | 832 | 61% | 23 |
| 2017 | 1,432 | 856 | 60% | 39 |
| 2018 | 1,493 | 750 | 50% | 10 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### 3.1.3.6 අනෙකුත් භාෂාවන් - උසස් පෙළ විභාගය -2018

ජාත්‍යන්තර රැකියා සහ අනෙකුත් අන්තර් සබදතා ඉලක්ක කරගෙන අනෙකුත් විෂයන් කලා මාධ්‍යයෙන් ඉගෙන ගන්නා සිසුන්ගේ ප්‍රතිඵල අතුරින් ප්‍රංශ හැර අනෙකුත් භාෂාවන් වල ප්‍රතිඵල යහපත් බව නිරීක්ෂණය වේ. ඒ අනුව ජර්මන්, රුසියන්, චීන හා ජපන් භාෂාව සමත් වීමේ ප්‍රතිශතය සියයට 61 ක් ඉක්මවූ මට්ටමක පැවතුණි. එම භාෂාවන් ප්‍රගුණ කිරිමට ඇති ඉඩ ප්‍රස්ථා පාසල් මට්ටමින් තවදුරටත් වැඩි කිරීමේ අවශ්‍යතාවය මෙහිදී කැපී පෙනුණි.

| විෂයය | පෙනී සිටි සංඛ්‍යාව | A සමත් | B සමත් | C සමත් | S සමත් | සමත් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| ප්‍රංශ | 877 | 04 | 24 | 139 | 276 | 51% |
| ජර්මන් | 249 | 71 | 51 | 52 | 44 | 87% |
| රුසියන් | 29 | 8 | 4 | 9 | 7 | 96% |
| චීන | 136 | 67 | 18 | 11 | 20 | 81% |
| ජපන් | 1,211 | 110 | 96 | 239 | 369 | 67% |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### 3.1.3.7 පාසල් තුළ වෘත්තීය මාර්ගෝපදේශනය

#### (අ) යෝජිත සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව

2016 යෝජිත සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවේ දක්වා ඇති පරිදි වෘත්තීය මාර්ගෝපදේශනය ලෙස සඳහන් වන්නේ පුද්ගලයන්ට ඕනෑම වයස් මට්ටමකදී හා ඔවුන්ගේ ජීවිත කාලය තුළ ඕනෑම අවස්ථාවකදී අධ්‍යාපනික, පුහුණු සහ වෘත්තීන් තෝරා ගැනීමේ සහ ඔවුන්ගේ වෘත්තීයමය කළමනාකරණයට සහාය වීමට අපේක්ෂිත සේවාවන් හා ක්‍රියාකාරකම් බවත් පාසැල්වල වෘත්තීය මාර්ගෝපදේශනය නැතිකම නිසා ඉගෙනුම ලබන්නන් බොහෝ සංඛ්‍යාවකට ඔවුන්ගේ රැකියා මාර්ග හෝ උසස් අධ්‍යාපනය හෝ පුහුණු අවස්ථා සොයා ගැනීමට නොහැකි වනු ඇති බව උක්ත ප්‍රතිපත්ති රාමුවේ දක්වා ඇත.

**(ආ) මාර්ගෝපදේශනය සඳහා යොමු විය යුතු අවධානය**

පාසල් පද්ධතිය තුළ වෘත්තීය මාර්ගෝපදේශනය ක්‍රියාත්මක වුවත් ඒ සඳහා පැවති අවධානය අඩු විම හේතුවෙන් පහත ගැටළු උද්ගත වන බව ජාතික අධ්‍යාපන කොමිසම මගින් හඳුනාගෙන තිබුණි.

(i) වෘත්තීය මාර්ගෝපදේශනය සහ අධ්‍යාපනික මාර්ගෝපදේශනය අතර වෙනස වටහා ගෙන නොමැති වීම.

(ii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමග තොරතුරු හුවමාරු කර ගනිමින් ශ්‍රම වෙළඳපොලේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ හා පුහුණුකරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් තුළින් පාසැල් පද්ධතිය අනාගත රැකියා වෙළඳපල සඳහා සූදානම් කළ යුතුවීම.

(iii) ඵලදායී වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් සම්පත් සහ විදුහල්පතිවරු හා ගුරුවරුන්ගේ මේ සම්බන්ධව පවතින කැපවීම අඩු වීම.

(iv) වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ගුරු සේවා ගණනයක් නොමැති වීම.

**(ඇ) රැකියා අවස්ථාවන් සඳහා නිවැරදි මඟ පෙන්වීමක් ලබාදීම.**

මෙම 2016 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා, මෙම වාර්තාවේ දින තෙක් සම්මත නොවීම මත ඉහත නිර්දේශයන් ක්‍රියාත්මකවීමට නෛතික බලපෑමක් නොමැති හෙයින් පාසල් මට්ටමේදී අ.පො.ස.(සා.පෙළ), අ.පො.ස.(උ.පෙළ) විභාග වලින් පසු තම රැකියා අභිලාෂයන් සඳහා නිවැරදි මඟ පෙන්වීමක් ලබා දීම සඳහා ඉහත නිර්දේශයන් ක්‍රියාත්මක නොවීම බාධාවක් වීම තුල මෙම ගැටලුව තවදුරටත් තීව්‍ර වී ඇති අතරම අනාගතය සඳහාද මෙවැනි ගැටලු පැවතීමට ඉඩකඩ සැදී ඇති බව විගණනය නිරීක්ෂණය කෙරේ.

### 3.1.3.8 අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාව ඇති කිරීම

**(අ) කලා විෂය ධාරාව හැදෑරීමට කෙරෙන බලපෑම**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විතියික පාසැල් 1,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති පරිදි තාක්ෂණ විෂය ධාරාව ඇති කිරීමේ ප්‍රධානතම හේතුව වූයේ දැනට අ.පො.(උ.පෙළ) හදාරන සිසුන්ගෙන් සියයට 22 ක් විද්‍යා ගණිත අංශයන්ද සියයට 27 ක් වාණිජ අංශයද සියයට 51 ක් කලා අංශයද තෝරා ගැනීම මගින් ඇතිවන විෂමතාවය අවම කිරීමයි. කලා අංශයෙන් අ.පො.(උ.පෙළ) සමත්ව විශ්වවිද්‍යාල උපාධිය ලැබූ තරුණ පිරිස් රැකියා වියුක්තියෙන් පෙළීම ආර්ථික සංවර්ධනයට හා සමාජීය ගැටළු ඇතිවීමට බලපාන

ගැටළුවකි. මේ නිසා උසස් පෙළ හදාරන විද්‍යා ගණිත හා තාක්ෂණවේදය විෂය ධාරා තෝරා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 40% දක්වා වැඩිකිරීම තුළින් කලා විෂය ධාරාව තෝරා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 25% ක් දක්වා අඩු කිරීම අපේක්ෂා කර තිබුණි. නමුත් එම අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකරගෙන නොමැති බව 2018 උසස් පෙළ ප්‍රවීණතා විශ්ලේෂණයේදී අනාවරණය වේ. විස්තර පහත පරිදි විය.

අ. පො. ස. (උසස් පෙළ) විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාව, කලා විෂය ධාරාව සඳහා 12 ශ්‍රේණිය සඳහා ශිෂ්‍ය ඉල්ලුම.

| වර්ෂය | මුලු ගණන | විද්‍යාව | ප්‍රතිශතය | වාණිජ | ප්‍රතිශතය | තාක්ෂණ වේදය | ප්‍රතිශතය | කලා | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | % | | % | | % | | % |
| 2012 | 160,580 | 37,588 | 23 | 48,593 | 30 | - | - | 74,399 | 46 |
| 2013 | 162,338 | 36,637 | 23 | 40,430 | 25 | 13,452 | 8 | 71,819 | 44 |
| 2014 | 156,332 | 37,853 | 24 | 37,774 | 24 | 13,253 | 8 | 67,452 | 43 |
| 2015 | 159,677 | 39,118 | 24 | 37,234 | 23 | 17,279 | 11 | 66,346 | 42 |
| 2016 | 164,732 | 35,570 | 22 | 38,656 | 23 | 17,955 | 11 | 72,551 | 44 |
| 2017 | 171,160 | 36,482 | 21 | 38,116 | 22 | 18,800 | 11 | 77,762 | 45 |
| 2018 | 198,439 | 46,654 | 24 | 39,114 | 20 | 23,593 | 12 | 89,078 | 45 |

**මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය**

මේ අනුව කලා විෂය ධාරාව හදාරන ප්‍රතිශතය සියයට 25 දක්වා අඩු කිරීමට බලාපොරොත්තු වුවද එය 2018 වන විට සියයට 45 ක් වැනි ඉහළ අගයක් දක්වා වර්ධනය වී ඇති බවත් නිරීක්ෂණය විය.

**(ආ) ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර ව්‍යාපෘතිය**

එම ව්‍යාපෘතියේ විය පැහැදම් හා සබැඳි ප්‍රතිඵල අංක 3 මගින් අ.පො.(උ.පෙළ) තාක්ෂණවේදය හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම හරහා කලා විෂය ධාරාව හදාරන සිසුන් ප්‍රමාණය අඩු කිරීම අපේක්ෂා කර ඇත. මේ අනුව 2018 වර්ෂය වන විට අ. පො. ස. (සා/පෙළ) ප්‍රතිඵල වැඩිවී අ. පො. ස. (උසස් පෙළ) සඳහා වැඩි දෙනෙකු සුදුසුකම් ලබමින් සිටින තත්ත්වයක විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවට ඉල්ලුම් කරන ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනයක් තිබුණද, කලා විෂය ධාරාවට ඉල්ලුම් කරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේද පසුබෑමක් දක්නට නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

අ.පො.ස (උසස් පෙළ) විද්‍යාව හා තාක්ෂණ විෂයධාරාව, කලා විෂයධාරාව 12 ශ්‍රේණිය සඳහා ශිෂ්‍ය ඉල්ලුම

| වර්ෂය | විද්‍යා විෂය ධාරාව + තාක්ෂණ විෂය ධාරාව | විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවේ එකතුව | වර්ධනයේ ප්‍රතිශතය | කලා විෂය ධාරාව | වර්ධනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2013 | 36,637 + 13,452 | 50,089 | - | 71,819 | - |
| 2014 | 37,853 + 13,253 | 51,106 | +2 | 67,452 | -6 |
| 2015 | 39,118 + 17,259 | 56,397 | +10 | 66,346 | -1.6 |
| 2016 | 35,570 + 17,955 | 53,525 | -5 | 72,251 | +9.4 |
| 2017 | 35,482 + 18,800 | 54,282 | +1.4 | 77,762 | +7.2 |
| 2018 | 46,654 + 23,593 | 70,247 | +29.4 | 89,078 | +14.5 |

**මූලාශ්‍රය-අධ්‍යාපන අමාත්‍යාංශය**

ඉහත දත්ත අනුව 2017 හා 2018 වර්ෂ සැලකීමේදී විද්‍යා හා තාක්ෂණ අංශයන්ට ශිෂ්‍ය ඉල්ලුම සියයට 30 කින් පමණ වර්ධනයක් තිබුණද, කලා විෂය ධාරාවට තිබූ ඉල්ලුමද සියයට 14 කින් පමණ වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය.

මේ සඳහා බලපාන ලද හේතූන් පහත පරිදි හඳුනා ගත හැකිවිය.

**(i) ගුරු පුරප්පාඩු පැවතීම**

තාක්ෂණවේදය විෂය ධාරාව උගන්වන ගුරුවරු සඳහා පහත පරිදි ගුරු පුරප්පාඩු පැවතුණි.

| විෂය | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු ගණනය කළ දිනය |
|---|---|---|
| ඉංජිනේරු තාක්ෂණවේදය | 35 | 2019-04-01 |
| ජෛව පද්ධති තාක්ෂණවේදය | 14 | 2018-12-31 |
| තාක්ෂණය සඳහා විද්‍යාව | 117 | 2017-12-31 |

**(ii) තාක්ෂණවේදය විෂය සඳහා පහසුකම් ප්‍රමාණවත් නොවීම**

ලංකාවේ විවිධ පළාත් නියෝජනය වන පරිදි විදුහල්පතිවරුන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව මානව හා භෞතික සම්පත්වල අවශ්‍යතා ඌනතාවයක් පැවතීම හේතුවෙන් තාක්ෂණවේදය විෂය හැදෑරීමට කැමති සිසුන් ඇතැම් පළාත්වල සිටියද විද්‍යාගාර නොමැතිවීම, ගුරුවරුන් නොමැතිවීම වැනි කරුණු මත සිසුන් එම විෂයෙන් ගිලිහෙන බව දක්වා ඇත.


**(iii)** **තාක්ෂණවේදය හැදෑරීමට අවශ්‍ය අවම ශිෂ්‍ය සංඛ්‍යාව**

අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 20/2016 දරණ චක්‍රලේඛය ප්‍රකාරව අ.පො.ස උසස් පෙළ තාක්ෂණවේදය විෂයධාරාව හැදෑරීම සඳහා අවම ශිෂ්‍ය සංඛ්‍යාව 15 ක් විය යුතු වුවත් ශිෂ්‍ය සංඛ්‍යාව 15 ට අඩු ජාතික පාසල් 02 ක් හා පළාත් පාසල් 39 ක් විය.

**(iv)** පහත දත්ත අනුව ලංකාවේ සියළු පළාත්වල උසස් පෙළ විද්‍යා විෂය සහිත පාසල් සංඛ්‍යාව 1029 ක් බවත් එම පාසල් වලින් තාක්ෂණවේදය විෂය සඳහා පාසල් සංඛ්‍යාව 395ක් එනම් සියයට 38 ක් පමණක් බවත් නිරීක්ෂණය විය. එසේම වැඩි ප්‍රමාණයක් එනම් පාසල් 1818ක් පවතින්නේ උසස්පෙල වාණිජ හා කලා විෂය ධාරා පමණක් උගන්වන ඒවා බවත් තවදුරටත් නිරීක්ෂණය විය. මෙම තත්ත්වයද සිසුන්ට තාක්ෂණ විෂය ධාරාව ඔස්සේ උසස් පෙල හැදෑරීමට බාධාවක් වන බවත් කලා හා වානිජ විෂය ධාරාවන් හැදෑරීමට පෙලඹෙන බවත් නිරීක්ෂණය විය.

| **පළාත** | **තාක්ෂණවේදය සහිත පාසල් සංඛ්‍යාව** | **උසස් පෙළ විද්‍යා විෂය සහිත පාසල් සංඛ්‍යාව** | **කලා හා වානිජ විෂය ධාරාව පවතින පාසල් සංඛ්‍යාව** |
|---|---|---|---|
| බස්නාහිර | 71 | 201 | 242 |
| මධ්‍යම | 54 | 114 | 319 |
| දකුණ | 49 | 149 | 216 |
| උතුර | 36 | 104 | 115 |
| නැගෙනහිර | 38 | 99 | 182 |
| වයඹ | 43 | 106 | 258 |
| උතුරු මැද | 33 | 64 | 130 |
| ඌව | 32 | 83 | 178 |
| සබරගමුව | 39 | 109 | 178 |
| | 395 | 1029 | 1818 |

**මූලාශ්‍රය-අධ්‍යාපන අමාත්‍යාංශය**




## 3.2 විශ්ව විද්‍යාල අධ්‍යාපනය

### 3.2.1 උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිහිටුවා ඇති අතර එකී පනතේ 3වන වගන්තිය අනුව මෙම කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණ පහත පරිදි විය.

i. ජාතික ප්‍රතිපත්තියට අනුකූලවන පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම;

ii. විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල් උසස් අධ්‍යාපන ආයතනවලට බෙදා වෙන්කර දීම සහ ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනය විසින් කරනු ලබන වියදම් පාලනය කිරීම;

iii. උසස් අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය තත්ත්වයන් පවත්වා ගැනීම;

iv. උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය විධිමත් කිරීම;

v. එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ශිෂ්‍යයන් ඇතුල් කිරීම විධිමත් කිරීම;

vi. මේ පනතින් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ හා නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම;

ඒ අනුව ඉහත අරමුණු අතරින් ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා විශේෂයෙන් ඉදිරිපත් කළ හැකි සංගෘහිත කරන ලද උසස් අධ්‍යාපන ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිර්මාණය කර නොමැති බව විගණනය වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක UGC/I/424 දරන 2019 දෙසැම්බර් 12 දිනැති ලිපියෙන් දන්වා ඇත.

### 3.2.2 විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම

**පසුගිය වසර 05 තුළ (2013-2017)** අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සියලුම අයදුම්කරුවන් අතුරින් සියයට 58 - සියයට 64 අතර ප්‍රතිශතයක් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන බව නිරීක්ෂණය වේ. ඉන් සියයට 17 - සියයට 19 අතර ප්‍රතිශතයක් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ඇතුළත් කර ගෙන තිබූ බව පහත දත්ත අනුව නිරීක්ෂණය වේ.

| | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
|---|---|---|---|---|---|
| උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 247,376 | 255,191 | 258,193 | 253,330 | 267,111 |
| විෂයයන් 03 සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලද ශිෂ්‍ය සංඛ්‍යාව | 149,489 | 155,447 | 160,520 | 163,104 | 167,907 |
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම්ලත් ප්‍රතිශතය | 60.43 | 60.91 | 62.17 | 64.38 | 62.86 |
| විශ්ව විද්‍යාලවලට ඇතුළත් කරගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 25,643 | 29,055 | 30,662 | 31,415 | දත්ත ලැබී නැත |
| සුදුසුකම්ලත් ශිෂ්‍යයන් අතරින් විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථාව ලැබී තිබූ ප්‍රතිශතය | 17.15 | 18.69 | 19.10 | 19.26 | - |

**මූලාශ්‍රය -ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

### 3.2.3 කලා උපාධි පාඨමාලා වෙත යොමුවීම

2017/2018 අධ්‍යයන වර්ෂයට අදාලව සලකා බැලීමේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන් සංඛ්‍යාව 78,894ක් ප්‍රමාණයක් වූ අතර ඉන් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 31,415 ක් විය. එම ප්‍රමාණයෙන් කලා විෂය ධාරාව සඳහා විශ්වවිද්‍යාල තුළට ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 9,923 ක් විය. ආසන්න අධ්‍යයන වර්ෂ 04 ක් සලකා බැලීමේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගනු ලැබූ මුළු සිසුන්ගෙන් කලා උපාධිය හදාරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 30 කට වඩා වැඩි ප්‍රමාණයක් බව පහත තොරතුරු අනුව නිරීක්ෂණය වේ.

**අධ්‍යයන වර්ෂ 04 කට අදාළව කලා උපාධි හදාරන ශිෂ්‍ය තොරතුරු**

| අධ්‍යන වර්ෂය | 2014/2015 | 2015/2016 | 2016/2017 | 2017/2018 |
|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අයදුම්කළ ශිෂ්‍ය සංඛ්‍යාව | 58,716 | 68,299 | 71,106 | 78,894 |
| විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 25,643 | 29,055 | 30,662 | 31,415 |
| තෝරාගත් කලා උපාධි අයදුම්කරුවන් සංඛ්‍යාව | 8,617 | 9,891 | 9,418 | 9,923 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන මුළු සිසුන්ගෙන් කලා උපාධිය හදාරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | 33.6 | 34 | 30.7 | 31.5 |


**මූලාශ්‍රය- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

මේ සම්බන්ධව පහත නිරීක්ෂණන් කෙරේ.

(අ) අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ කාණ්ඩ තුළ සුදුසුකම් සපුරාලන ලද සිසුන්ගේ සේවා වියුක්තිය සියයට 9.1 ක් වීම තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිටවන උපාධිධාරීන් කෙටිකාලීනව හෝ දිගුකාලීන වශයෙන් සේවා වියුක්ත වීම ඇතුළත් වේ. වාර්ෂිකව උපාධිධාරීන් 26,000 ක් විශ්වවිද්‍යාලවලින් පිටවන අතර කලා පීඨයන් පවතින විශ්වවිද්‍යාල 12 අධ්‍යනාංශ 140 කින් උපාධි පාඨමාලා හදාරන කලා උපාධිධාරීන් සංඛ්‍යාව 10305 ක් විය.

(ආ) පසුගිය වර්ෂ 08 ක් තුළ විශ්වවිද්‍යාලවලින් පිටවූ මුළු උපාධිධාරීන් සංඛ්‍යාව සහ ඒ තුළ ඇතුළත් වූ කලා උපාධිධාරීන්ගේ තොරතුරු පහත වගුවේ දැක්වේ. 2017 තොරතුරු අනුව සමස්ත උපාධිධාරීන්ගෙන් සියයට 40 ක් පමණ කලා උපාධිධාරීන් නියෝජනය වන බව අනාවරණය වේ.

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| උපාධිධාරීන් සංඛ්‍යාව | 13042 | 16686 | 11614 | 20839 | 28231 | 29545 | 28808 | 26015 |
| කලා උපාධිධාරීන් | 4432 | 6940 | 5330 | 9156 | 14651 | 16387 | 14082 | 10305 |
| සමස්තඋපාධිධාරීන්ගෙන් කලාඋපාධිධාරීන් ප්‍රතිශතය | 33.9 | 40.3 | 45.8 | 43.9 | 51.9 | 55.4 | 49.0 | 39.6 |




**මූලාශ්‍රය- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

මෙම තොරතුරු මත පදනම්ව උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය පහත සංරචක මත ඇගයීමට ලක්කිරීම සිදුකරන ලදී.

### 3.2.4 නව පාඨමාලා නිර්මාණය කිරීම හා හඳුන්වාදීම

(අ) එක් එක් විශ්වවිද්‍යාල විසින් වසර 10 ක් තුල හඳුන්වා දී ඇති පාඨමාලා ගණන සලකා බැලීමේදී විශ්වවිද්‍යාල 03 ක කිසිඳු නව උපාධි පාඨමාලාවක් හඳන්වා දී නොතිබුණ අතර අනෙක් විශ්වවිද්‍යාල මගින් නව පාඨමාලා හඳුන්වාදීම ඉතා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | විශ්වවිද්‍යාලය | හඳුන්වා දී ඇති නව පාඨමාලා සංඛ්‍යාව | නව පාඨමාලා හඳුන්වා දී ඇති වර්ෂය පාඨමාලා සංඛ්‍යාව |
|---|---|---|---|
| i | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නැත | |
| ii | කැලණිය විශ්වවිද්‍යාලය | 09 | 2013/2014 – 02 |
| | | | 2014/2015 – 01 |
| | | | 2015/2016 – 04 |
| | | | 2016/2017 – 01 |
| | | | 2017/2018 – 01 |
| iii | රුහුණු විශ්වවිද්‍යාලය | 08 | 2009/2010 – 02 |
| | | | 2011/2012 – 02 |
| | | | 2015/2016 – 03 |
| | | | 2017/2018 – 01 |
| iv | කොළඹ විශ්වවිද්‍යාලය | 03 | 2016/2017 |
| v | ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 05 | 2011/2012 – 01 |
| | | | 2015/2016 – 04 |
| vi | සෞන්දර්ය විශ්වවිද්‍යාලය | නැත | |
| vii | මොරටුව විශ්වවිද්‍යාලය | 03 | 2009/2010 – 01 |
| | | | 2010/2011 – 01 |
| | | | 2016/2017 – 01 |
| viii | යාපනය විශ්වවිද්‍යාලය | 03 | 2013/2014 – 01 |
| | | | 2015/2016 – 01 |
| ix | අග්නිදිග විශ්වවිද්‍යාලය | 02 | 2015/2016 |
| x | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 02 | 2015/2016 |
| xi | රජරට විශ්වවිද්‍යාලය | 04 | 2010/2011 – 01 |
| | | | 2015/2016 – 03 |

(ආ) විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන 11 කට අදාළ කලා විෂය ධාරාවට අදාළ උපාධි පාඨමාලා කලා පීඨ 13 ක් යටතේ පවත්වාගෙන යනු ලබයි. මෙම කලා උපාධි පාඨමාලාවට අදාළ නව පාඨමාලා හඳුන්වාදීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී 2009/2010 අධ්‍යයන වර්ෂයේ සිට 2017/2018 අධ්‍යයන වර්ෂය දක්වා විශ්වවිද්‍යාලවල පවත්වාගෙන යනු ලබන පාඨමාලාවලට අදාළව නව උපාධි පාඨමාලා 49 ක් හඳුන්වා දී තිබුණද කලා විෂය ධාරාවට අදාළව හඳුන්වා දී තිබූ නව පාඨමාලා සංඛ්‍යාව 02 ක් පමණක් විය. (Translation Studies/Film and Television Studies)

### 3.2.5 ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව, වරප්‍රදාන (ප්‍රතීතන), ප්‍රමිති සුරැකුම් මණ්ඩලයක් පිහිටුවීම සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ සභාවක් පිහිටුවීම

ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත්කිරීම සඳහා සුදුසු පරිසරයක් සකස් කිරීමේදී උසස් අධ්‍යාපනයට ඇති අවස්ථාවන් පුළුල් කිරීම සහ එහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පරිපූර්ණ නීති රාමුවක අවශ්‍යතාවය 2010 ජනවාරි 31 දිනැති අංක HE/AD/2011/12 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අවධාරණය කර තිබුණි. ඒ සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ඇතිකරගැනීම පිණිස "සුදුසුකම් රාමුව වරප්‍රදානය (ප්‍රතීතනය) සහ ප්‍රමිති සුරැකුම" සඳහා වන මණ්ඩලයක් පිහිටුවීම සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ සභාවක් පිහිටුවීම සඳහා වන නීති රාමුවක් සැකසිය යුතු බව දක්වා ඇත. මෙම කාර්යය වෙනුවෙන් උසස් අධ්‍යාපන තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුණද 2020 පෙබරවාරි 17 දින වන විටත් එකී නෛතික රාමුව බලාත්මක වී නොතිබුණි.


## 3.3 සේවා නියුක්තිය හා කලා විෂය ධාරාව

### 3.3.1 රැකියා සඳහා යොමුවන ක්ෂේත්‍රය

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන කාර්තුමය ශ්‍රමබල සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය අඛණ්ඩව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රැකියා උත්පාදන අංශය ලෙස වාර්තා කරමින් 2018 වසරේ සමස්ථ සේවා නියුක්තියට සියයට 43.4 ක ඉහළම දායකත්වයක් ලබාදී ඇති බව 2018 මහබැංකු වාර්තාවේ දක්වා ඇත. විස්තර පහත දැක්වේ.

**රැකියාව අනුව සේවා නියුක්තිය 2018**

| | |
|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් | 14.5 |
| පෞද්ගලික අංශයේ සේවකයන් | 43.4 |
| ස්වයං රැකියා නියුතුවූවන් | 42.2 |




ඉහත දත්ත අනුව රැකියා ක්ෂේත්‍ර වෙත යොමු වීමේදී පෞද්ගලික අංශයෙන් වැඩි ඉඩකඩක් ලැබී ඇති අතරම ඒ හා සමාන ප්‍රතිශතයක් ස්වයං රැකියා සඳහා යොමු වී ඇත. එසේම රාජ්‍ය අංශයේ රැකියා නියුක්තිය පෞද්ගලික අංශයේ රැකියා නියුක්තියෙන් 1/3 කට ආසන්න අගයක් විය. එසේ වුවද කලා උපාධිධාරීන් වැඩි වරණයක් ලබා දී ඇත්තේ රාජ්‍ය අංශයේ රැකියා වලට බව පහත කරුණු අනුව ද තහවුරු විය.

(අ) පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා බහුල වුවද ඒ සඳහා අවශ්‍ය වන දැනුම හැකියාව සම්බන්ධ ගැටලු පැවතීම හා රාජ්‍ය අංශයේ රැකියා වල සුරක්ෂිතතාවය සහ විශ්‍රාම වැටුප් පදනම් කර ගනිමින් කලා උපාධිධාරීන් රජයේ රැකියාවක් බලාපොරොත්තුවෙන් දිගු කාලයක් සේවා වියුක්ත වීමේ තත්ත්වයක් ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද රාජ්‍ය හා පෞද්ගලික අංශය යන දෙඅංශය තුළම කලා උපාධිධාරීන්ට පුළුල් රැකියා ඉඩකඩක් නොමැති බවද නිරීක්ෂණය විය.

(ආ) උසස්පෙළ හැදෑරීම සඳහා කලා විෂයධාරාව තෝරා ගැනීමට හේතු වූ කරුණු මොනවාද යන්න පිළිබඳ නියැදි පදනමකින් තෝරාගත් පාසල් සිසුන්ගෙන් කළ තොරතුරු විමසීමේදී පිළිතුර වූයේ රජයේ රැකියාවක් කිරීම අරමුණ වන බවයි.

(ඇ) කැලණිය හා ජයවර්ධනපුර යන විශ්වවිද්‍යාලවල කලා උපාධිය හදාරන ශිෂ්‍යයින්ගෙන් ප්‍රශ්නාවලියක් මගින් කලා මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීමට හේතු හා අනාගත රැකියා අපේක්ෂාව පිළිබඳ විමසීමේදී ඉන් බහුතර සිසුන් පිරිසකගේ පිළිතුරු වී තිබුණේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු රජයේ රැකියාවක් බලාපොරොත්තු බව බවය.

(ඈ) රැකියාවිරහිත උපාධිධාරීන්ගේ නියෝජනයකදීද ඒ පිළිබඳ අදහස් විමසීමේදී අනාවරණය වූයේ ඔවුන් රජයේ රැකියාවක් අරමුණු කරගෙන සිටීම මත විරැකියාවෙන් පෙලෙන බවයි.


ඒ අනුව පාසැල් මට්ටමෙන් හා විශ්විද්‍යාල මට්ටමෙන් අනාගත රැකියා අපේක්ෂාව ලෙස රාජ්‍ය අංශය තෝරා ගැනීම තුල ඉතා සීමිත රැකියා අවස්ථාවන් (රැකියා 20,000 ක් පමණ) ඉලක්ක කරගෙන දිගුකාලයක් සේවා වියුක්තව සිටීමට සිදුවීම හා රටේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල දායකත්වයක් කරනු ලබන නිෂ්පාදන/කාර්මික අංශය නියෝජනය කරනු ලබන පෞද්ගලික අංශයට දායකත්වයක් නොලැබීම සිදුවේ. ඒ අනුව පෞද්ගලික අංශයේ රැකියා තුලින් ආර්ථික වශයෙන් ලබා ගත හැකි වාසි, උත්සාහය හා නිර්මාණාත්මක බව මෙන්ම කැපවීම මත පෞද්ගලික අංශය තුලින් ජීවිතය ගොඩනගා ගැනීමට අවශ්‍යතාවන් ඇති බවට වන පණිවිඩය ප්‍රචලිත කිරීම ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය තුලින් සිදු කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

### 3.3.2 සමස්ථ උපාධිධාරින්ගේ රැකියා නියුක්තිභාවය සම්බන්ධ පර්යේෂණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016/2017 අධ්‍යයන වර්ෂවල විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ සේවා නියුක්තිභාවය පිළිබඳ සිදුකරනු ලැබූ පර්යේෂණය පිළිබඳ විගණනයේදී වැඩි අවධානයක් යොමු වූ අතර එහි ඇතුළත් දත්ත ආශ්‍රයෙන් පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කෙරේ.

#### 3.3.2.1 රැකියා නියුක්තිභාවය

රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා ගත් උපාධිධාරින්ගේ රැකියා නියුක්තිභාවය පමණක් මෙහිදී සලකා බලන ලදී. සමීක්ෂණයකට ලක්කල සමස්ථ උපාධිධාරීන්ගෙන් සියයට 65.5 ක් ස්ථිර රැකියාවක නිරතව සිටි අතර සියයට 2.4 ක් ස්වයං රැකියාවක නියුක්තව සිටින ලදී. මෙම ගහණනයෙන් සේවා වියුක්තව සිටි ප්‍රමාණය සියයට 32.1 ක් විය.




මෙම රැකියා නියුක්ති මට්ටම, පහත දැක්වෙන කරුණු කිහිපයක් මත තීරණය වන බව නිරීක්ෂණය විය.


#### 3.3.2.2 කලා උපාධිධාරීන්ගේ රැකියා වර්ගීකරණය

කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්ත අංශය සලකා බැලීමේදී සියයට 52.7 ක් රාජ්‍ය අංශයේ රැකියාවක ද සියයට 31.2 ක් පෞද්ගලික අංශයේ රැකියාවල නිරතව සිටී. මෙම රාජ්‍ය අංශයේ රැකියා නියුක්තිකයන්ගෙන් සියයට 32.9 ක් ගුරු වෘත්තියෙහි යෙදී ඇති බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සිදුකළ පර්යේෂණ වාර්තාවෙන් අනාවරණය කරගෙන තිබුණි.

ඉහත සමස්ත තත්ත්වය මත පදනම්ව ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2016,2017 සහ 2018 වර්ෂ පදනම්ව කරන ලද සමීක්ෂණය අනුව පිළිවෙළින් සියයට 63.6 ක්, සියයට 43.1 ක් සහ සියයට 37.2 ක් රාජ්‍ය අංශයේ ද, සියයට 32.1, සියයට 47.7 ක් සහ සියයට 57.3 ක් පෞද්ගලික අංශයේද රැකියාවල නියුක්තව තිබුණි. කලා උපාධිධාරීන් බොහොමයක් කළමනාකරණය පිළිබඳ පවතින මූලික දැනුම අඩුවීම මත තමන්ගේම රැකියාවක නිරතවීමට (Self-Employment) අකමැත්තක් දක්වන බව අනාවරණය කරගෙන තිබුණි.

### 3.3.2.3 උපාධිය හදාරන මාධ්‍ය අනුව

(අ) උක්ත පර්යේෂණය අනුව ඉංග්‍රීසි මාධ්‍යය උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සියයට 81.2 ක් වැනි ඉහළ මට්ටමක පැවතිය ද සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් උපාධිය හදාරනු ලැබූ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය පිළිවෙලින් සියයට 46.9 ක් සියයට 27.6 ක් වැනි පහළ මට්ටමක පැවතී බව නිරීක්ෂණය විය.




උපාධිය හදාරන මාධ්‍යය අනුව රැකියා නියුක්තිභාවය

(ආ) ඉංග්‍රීසි මාධ්‍යය උපාධිධාරීන් හට ඉහළ සේවා නියුක්ති මට්ටමකට ප්‍රවේශවීමට අවස්ථාව තිබුණ ද විශ්වවිද්‍යාල 11ක පවත්වා ගෙන යනු ලබන උපාධි පාඨමාලා අතරින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වා ගෙනයනු ලබන පාඨමාලා සංඛ්‍යාව සාපේක්ෂව පහළ මට්ටමක පවතින බව පහත තොරතුරු අනුව නිරීක්ෂණය විය.

| විශ්වවිද්‍යාලය | පවත්වන මුළු කලා උපාධි පාඨමාලා ගණන | ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන කලා උපාධි පාඨමාලා ගණන |
|---|---|---|
| කැලණිය | 69 | 16 |
| ශ්‍රී ජයවර්ධනපුර | 27 | 22 |
| පේරාදෙණිය | 22 | 19 |
| කොළඹ | 19 | 17 |
| සබරගමුව | 15 | 07 |
| නැගෙනහිර | 13 | සියළු පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් |
| ඌව වෙල්ලස්ස | 20 | - |
| රුහුණ | 12 | 05 |
| රජරට | 16 | 04 |
| අග්නිදිග | 19 | 09 |
| යාපනය | 25 | සියළු පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් |
| | **257** | **99** |

**මූලාශ්‍රය- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

2018 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාල 11 කට අදාළව පීඨ 13 ක් යටතේ කලා උපාධියට අදාළව පවත්වාගෙන යනු ලැබූ උපාධි පාඨමාලා 257 ක් අතුරින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සංඛ්‍යාව 99ක් විය.

(ඇ) මෙම ගැටලුව සම්බන්ධයෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය මගින් සිදුකරන ලද පර්යේෂණ වාර්තාවෙන් පහත කරුණු අනාවරණය විය.

(i) එම සමීක්ෂණයකට අනුව ඉංග්‍රීසි, ඉංග්‍රීසි සාහිත්‍ය හා තොරතුරු තාක්ෂණ උපාධිය වැනි විෂය ධාරාවන් හදාරනු ලැබූ සිසුන්ගේ රැකියා නියුක්තිභාවය ඉතා ඉහළ මට්ටමක පවතින බව හඳුනාගෙන තිබූ අතර 2017 වසරේදී මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂය මගින් තොරතුරු තාක්ෂණ විශේෂ උපාධිය සහ සමාජ සංඛ්‍යානය පාඨමාලා හඳුන්වාදී තිබීම කලා උපාධිධාරීන් ඉහළ රැකියා නියුක්ති මට්ටමකට යොමුකිරීමට හේතු සාධකයක් වී ඇත.

(ii) 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨය යටතේ පැවැත්වෙන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් 08 ක් යටතේ හැදෑරීමට අවස්ථාව ලබාදීම තුලින් එම උපාධි පාඨමාලා සම්පූර්ණ කරන ලද  සිසුන්ගේ රැකියා නියුක්තිභාවය ඉහල අගයක් ගෙන ඇති බව සමීක්ෂණ තුලින් හෙලිදරව් වී තිබුණි.

(iii) කලා පීඨයන් සඳහා බඳවාගන්නා බහුතරය කාන්තා උපාධි අපේක්ෂිකාවන්වීමත් සහ බහුතරය සිංහල මාධ්‍යයෙන් උපාධිය හැදෑරීමත් පෞද්ගලික අංශයේ රැකියා නියුක්තියට ඇති ඉඩප්‍රස්ථා අඩුවීමට හේතු වී ඇති බව මේ අනුව නිරීක්ෂණය කළ හැකි විය.


### 3.3.2.4 සීමාවාසික පුහුණුව ලබා තිබීම

(අ) උපාධිධාරීන් රැකියා නියුක්ත වීමේදී සීමා වාසික පුහුණුව උපකාරී වන බවට උක්ත පර්යේෂණයෙන් අනාවරණය කරගෙන තිබුණි. මේ අනුව සීමාවාසික පුහුණුවක් ලැබූ උපාධිධාරීන්ගෙන් සියයට 74.3 කට ආසන්න ප්‍රමාණයක් රැකියාවක නිරත වී ඇති බවත් සීමාවාසික පුහුණුවක් නොලැබූ උපාධිධාරීන්ගෙන් සියයට 53.6 ක ප්‍රමාණයක් පමණක් රැකියා නියුක්තව සිටින බව සමීක්ෂණය මගින් අනාවරණය කරගෙන ඇත. මේ අනුව කලා උපාධිධාරීන් සඳහා සීමාවාසික පුහුණු අවස්ථා නොමැතිවීම එම උපාධිධාරීන්ගේ රැකියා නියුක්තාභාවය අඩු කිරීමට හේතුවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මකවන සීමාවාසික පුහුණු වැඩසටහන හේතුවෙන් 2017 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ රැකියාවල නියුතු උපාධිධාරීන් සංඛ්‍යාව සියයට 0.6 සිට සියයට 10.2 දක්වා වර්ධනයක් නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන අතරතුර සීමාවාසික පුහුණුවක අවශ්‍යතාවය පිළිබඳව කැලණිය හා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කලා උපාධි පීඨවල අධ්‍යාපන කටයුතු කරගෙන යනු ලබන සිසුන්ගෙන් විගණනයට ලබාගත් අදහස් අනුව ඔවුන් වෙත දැනට ලබන සීමාවාසික පුහුණුව ප්‍රමාණවත් නොවන බවට පහත පරිදි අදහස් දක්වා තිබුණි.

| විශ්වවිද්‍යාලය | උපාධි පාඨමාලාව | පොදුවේ සිසුන් දක්වන ලද අදහස් |
| --- | --- | --- |
| කැළණිය විශ්ව විද්‍යාලය | පරිවර්තන අධ්‍යයනය | මේ වන විට ලබාදෙන පුහුණු කාලය ප්‍රමාණවත් නොවන බැවින් අවම වශයෙන් මාස 06 කාලයක්වත් විය යුතු බව |
| | ජන සන්නිවේදනය | - එම - |
| | සාමය හා ගැටුම්කරණය | ප්‍රායෝගික පුහුණුව අවශ්‍ය බව |
| | සංවර්ධනය අධ්‍යයනය (විශේෂවේදී) | ප්‍රායෝගික පුහුණුව ප්‍රමාණවත් නොවන බව |
| | දේශපාලන විද්‍යාව (විශේෂවේදී) | පුහුණු කාලය ප්‍රමාණවත් නොවන බැවින් අවම පුහුණු කාලය මාස 06 ක්වත් විය යුතුය. |
| | පුස්තකාල හා විඥාපන විද්‍යාව | ප්‍රායෝගික පුහුණුව අවශ්‍ය බව |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ යටතේ පැවැත්වෙන උපාධි පාඨමාලා | ප්‍රායෝගික පුහුණුව හා වෘත්තීය පුහුණුව අවශ්‍ය බව |

(ඇ) සමස්ත උපාධිධාරීන් සමඟ සලකා බැලීමේදී කලා උපාධිධාරීන්ගෙන් වෘත්තිය පුහුණුවක් ලැබූ උපාධිධාරීන් සංඛ්‍යාව සියයට 23.8 ක් වැනි පහළ මට්ටමක පැවතීම රැකියාවක් ලබා ගැනීමට ඇති ඉඩප්‍රස්ථා පහළයාමට හේතුවී ඇති බව පහත වගුව අනුව නිරීක්ෂණය වේ.



### 3.3.2.5 පරිගණක හැකියාව මත රැකියා අවස්ථා සැලසී තිබීම

(අ) පරිගණක හැකියාව හා පළපුරුද්ද ලබා තිබීම රැකියාවක් ලබා ගැනීමේදී තීරණාත්මක සාධකයක් ලෙස හඳුනා ගත හැකිය. කැලණිය විශ්වවිද්‍යාලයේ කලා උපාධි අපේක්ෂකයින්ගෙන් ලබාගත් තොරතුරු අනුව උපාධි පාඨමාලා විෂය නිර්දේශයන් තුල ඉංග්‍රීසි හා පරිගණක දැනුම ලබාගැනීම අනිවාර්යය විෂයක් ලෙස ඇතුළත් කළයුතු බව හඳුනාගෙන තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදුකළ පර්යේෂණ වාර්තාව අනුව රැකියා නියුක්තිභාවය හා විශ්වවිද්‍යාල අධ්‍යයන කාලය තුළ ඉංග්‍රීසි භාෂා භාවිතය අතර පැහැදිලි සබඳතාවයක් නිරීක්ෂණය වී තිබුණි. එම වාර්තාවේ පර්යේෂණ සොයා ගැනීම් අනුව උපාධි අපේක්ෂක කාලය තුල ඉංග්‍රීසි චිත්‍රපට නරඹන හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දුරකතන පණිවුඩ යවන උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්තිභාවය සියයට 79.7 ක ඉහළ මට්ටමක පවතින බව අනාවරණය වී තිබුණි.

### 3.3.2.6රැකියාවක නිරත නොවන උපාධිධාරින්

(අ) සමස්ථ උපාධිධාරින්ගෙන් කාන්තා හා පිරිමි උපාධිධාරින් පිළිවෙළින් සියයට 40ක් හා සියයට 18කට තම උපාධිය සම්පූර්ණ කර රැකියාවක් ලබා ගැනීමට වසර 2 සිට 3 දක්වා නිරීක්ෂණය විය.

රැකියාවක නිරත නොවන කලා උපාධිධාරින් සංඛ්‍යාව සියයට 50.4 ක් වී තිබූ අතර මෙම සංඛ්‍යාවෙන් සියයට 83 ක්ම කාන්තා උපාධිධාරින් ලෙසද හඳුනා ගෙන ඇත. විශාල කාන්තා උපාධි අපේක්ෂිකාවන් සංඛ්‍යාවක් කලා උපාධිධාරින් ලෙස විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගැනීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තව දුරටත් පරීක්ෂා කිරීමේදී උපාධිධාරින් සේවා වියුක්ති තත්ත්වයට පත්වීමට බලපාන සාධක ලෙස පහත කරුණු හඳුනා ගත හැක.

(i) වැඩ සම්බන්ධව පවතින පලපුරුද්ද
(ii) සුදුසු රැකියාවක් සොයා ගැනීමට නොහැකි වීම
(iii) වෘත්තීය සුදුසුකම් නොමැති විම
(iv) සේවාදායකයින් සමඟ සබඳතා නොමැති වීම
(v) රාජ්‍ය සේවයේ රැකියාවක් බලාපොරොත්තුවෙන් පසු වීම
(vi) වැඩිදුර අධ්‍යාපන කටයුතු හැදෑරීමට යොමුවීම
(vii) පෞද්ගලිකව රැකියාවක නිරතවීමට ඇති අකමැත්ත
(viii) සන්නිවේදන හැකියාව නොමැතිවීම

(ආ) ඉහත කරුණු සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් 105 කට ඉදිරිපත් කළ ප්‍රශ්නාවලිය ඇසුරින් කරන ලද නියැදි පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

i. විෂය නිර්දේශය සංශෝධනය වීම සම්බන්ධව අදහස් දක්වා තිබූ ආකාරය අනුව සිසුන්ගෙන් සියයට 10 ක ප්‍රමණයක් අදාළ විෂය නිර්දේශයන් රැකියා වෙළඳපොලට අනුව ගැලපිමි කළ යුතු බව ප්‍රකාශ කර තිබූ අතර නියැදියෙන් සියයට 22 ක් විෂය නිර්දේශය යාවත්කාලීන විය යුතු බව හා සංඛ්‍යානය විෂයද විෂය නිර්දේෂයට ඇතුළත් වියයුතු බව දක්වා තිබුණි. එසේම නියැදියෙන් සියයට 30 ක් තොරතුරු තාක්ෂණය හා ප්‍රායෝගික පුහුණුව අපේක්ෂා කරන බවත් සියයට 09 ක් වෘත්තීය පුහුණුව ද එක් කළ යුතු බව ද ප්‍රකාශ කර තිබුණි. තව ද බාහිර ක්‍රියාකාරකම් ද එක්කළ යුතු බව සියයට 05 ක් ප්‍රකාශ කර තිබුණි.

ii. පරිගණක, ඉංග්‍රීසි භාෂාව හා නායකත්ව කුසලතා ඇතුළත් මෘදු කුසලතා වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ දායකත්වය ප්‍රමාණවත් නොවන බව සිසුන් 25 ක් පමණක් ප්‍රකාශ කර තිබූ අතර ඉතිරි සියළුම සිසුන් දක්වා තිබුණේ එය ප්‍රමාණවත් බවය.

iii. උපාධි පාඨමාලාවෙන් ලැබිය යුතු සාමාන්‍ය හා විශේෂ කුසලතා ලැබීම සම්බන්ධයෙන් තමන් සෑහීමකට පත් නොවන බව නියැඳියෙන් සියයට 62 ක් ප්‍රකාශ කර තිබුණි.

iv. උපාධිධාරියකු ලෙස විශ්වවිද්‍යාලයෙන් පිටවී යන විට තමා හැදෑරූ උපාධියට ගැළපෙන රැකියාවක් අපේක්ෂා කරන බව නියැඳියෙන් බහුතරයක් වන සියයට 40 ක් දක්වා තිබුණු අතර ඉතිරි සිසුන්ගෙන් සියයට 14 ක් රජයේ රැකියාවක් ද, සියයට 03 ක් පෞද්ගලික අංශයේ රැකියාවක්ද, සියයට 06 ක් රජයේ හෝ පෞද්ගලික අංශයේ ද, සියයට 17 ක් විධායක ශ්‍රේණියේ රැකියාවක්ද, සියයට 20 ක් වෙනත් රැකියාවක්ද අපේක්ෂා කරන බව දක්වා තිබුණි.

v. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ උපාධි අපේක්ෂකයින්ට ලබාදුන් ප්‍රශ්නාවලි හරහා ලබාගත් තොරතුරු අනුව රැකියා අවස්ථා ලබාගැනීම සම්බන්ධයෙන් සුදුසු මාර්ගෝපදේශනයක් හෝ අනුග්‍රහයක් නොලැබෙන බව සිසුන් 28 දෙනෙක් ප්‍රකාශ කර තිබුණි.

vi. ප්‍රශ්නාවලි ඇසුරින් උපාධි අපේක්ෂකයන් කලා උපාධි අපේක්ෂයන්ගෙන් ලබා ගත් තොරතුරු අනුව සියයට 60 කගේ අදහස වී තිබුණේ තම උපාධි පාඨමාලා හරහා ශ්‍රම වෙළඳපල ඉල්ලුමට ගැළපෙන පරිදි තොරතුරු තාක්ෂණ දැනුම ඉංග්‍රීසි දැනුම නොලැබෙන බවයි.

vii. රැකියා ක්ෂේත්‍රයේ සේවා යෝජකයින් සහ විශ්වවිද්‍යාල අතර සම්බන්ධතාවයක් තිබිය යුතු බව උපාධි අපේක්ෂකයන් විසින් අදහස් දක්වා ඇති අතර එමගින් රැකියා වෙළඳපලට අදාල තොරතුරු හුවමාරු වීමත් පාඨමාලාවල ආකර්ශනය පිළිබඳ අදහසක් ඇති කර ගැනීමට හැකියාව ඇති බවත් නිරීක්ෂණය විය.

**3.3.2.7 උපාධිධාරින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්බන්ධව දරන ආකල්පය**

විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින් ලබා ගත් දැනුම ශ්‍රම වෙළඳපලට කොතෙක් දුරට ගැලපේද යන්න සහ උපාධිධාරින් සම්බන්ධව රැකියා වෙළඳපල දරන්නා වූ මතය සලකා බැලීමේදී සියයට 44.7ක් වූ කලා උපාධිධාරින් තමන්ගේ උපාධිය තමන් කරන රැකියාව සම්බන්ධව කිසිදු ගැලපීමක් නොමැතිබවත් කලා උපාධිය සාමාන්‍යයෙන් රැකියාවක් කිරීම අරබයා පාදක වූ උපාධියක් ලෙසද සලකනු නොලබන බවත් සියයට 84 ක් වූ උපාධිධාරින් තමන්ට රැකියාවක් ලබා ගැනීමට පහත සඳහන් දක්ෂතා තිබිය යුතු බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පර්යේෂණ වාර්තාවේ දක්වා තිබුණි.

(i) ඉංග්‍රීසි භාෂාවේ දක්ෂතාවය (English Language Skills)
(ii) සන්නිවේදන දක්ෂතා (Communication Skills)
(iii) ඉදිරිපත් කිරීමේ දක්ෂතා (Presentation Skills)
(iv) නායකත්ව හැකියාව (Leader ship Skills)
(v) වෙනත්

**3.3.3 ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය (ජා.මා.ස.සේ.ප්‍ර.)**

(අ) ශ්‍රී ලංකාවෙහි මානව සම්පත් සංවර්ධන කටයුතු, ශ්‍රී ලාංකිකයන් වෙත පූර්ණ, සුනිසි හා ඵලදායී රැකියා සැපයීමට රජයන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පාලනය කරන්නාවූ, පරිපූර්ණ ප්‍රතිපත්ති රාමුව ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය වේ. සමස්ත රාජ්‍ය ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර ඇත. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය මානව සම්පත් සංවර්ධන හා රැකියා ප්‍රවර්ධන කටයුතුවලදී අදාළ හා වැදගත් වන විෂය ක්ෂේත්‍ර ගණනාවක් මින් ආවරණය කර ඇත.

(ආ) ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ආයතන හා අධිකාරී ගණනාවක් වෙත පැවරෙන අතර එම කටයුතු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය මගින් සම්බන්ධීකරණය වේ.

(ඇ) ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියෙහි අරමුණු පහත සඳහන් වේ.

(i) ශ්‍රී ලංකාවේ සියළුම කාන්තාවන්ට හා මිනිසුන්ට පූර්ණ, ඵලදායී හා නිදහසේ තෝරාගත් රැකියා අත්පත් කර ගැනීමේ හැකියාව සලසා දෙන තත්ත්වයන් දිරි ගැන්වීම.

(ii) ඉහළ දක්ෂතාවයෙන් යුතු, ගෝලීය වශයෙන් තරඟකාරී, බහුවිධ කුසලතා සහිත ඵලදායී ශ්‍රම බලකායක් ගොඩනැංවීම.

(iii) විවිධ අංශවල හා ප්‍රදේශවල වැඩ කරන ජනතාවගේ ආදායම හා ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

(iv) සේවක අභිප්‍රේරණය හා ඵලදායීතාව උපරිම මට්ටමට ගෙන එන පරිදි, වඩාත් ගැළපෙන රැකියාවන්ට සුදුසුකම් ලැබීමටත්, එබඳු රැකියාවන්හි තම කුසලතා හා සම්පන්නතා භාවිතා කිරීමටත්, අසාධාරණ සැලකීමෙන් තොරව සෑම සේවකයෙකුටම හැකියාව ලැබෙන පරිදි ඔවුන්ට පූර්ණ අවස්ථා සපයා දීම.

(v) ජාතික කම්කරු නීති හා ප්‍රධාන ජාත්‍යන්තර කම්කරු සම්මතයන්ට අනුකූලව සේවකයන්ගේ මූලික අයිතිවාසිකම් හා ඕනෑ එපාකම් සුරක්ෂිත කිරීම.

(ඈ) මෙවැනි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ ජාතික අවශ්‍යතාවය පහත පරිදි හඳුනාගෙන තිබුණි.

(i) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්ෂික (2016) ශ්‍රම බලකා සමීක්ෂණ දත්ත අනුව, ආසන්න වශයෙන් මිලියන 21.3 පමණ වන ශ්‍රී ලාංකේය ජනගහනය අතුරින් මිලියන 15.45 ක් වයස අවුරුදු 15 වැඩි නම් එනම්, නීත්‍යානුකූලව සේවා නියුක්තිය සඳහා සුදුසු වයස් කාණ්ඩයන්ට අයත් වේ. එහෙත් වර්තමානයේ සේවා නියුක්තිය ඉන් අඩක්, එනම් මිලියන 8.31 පමණ වේ.

(ii) රටේ සමස්ත රැකියා විරහිතභාවය ආසන්න වශයෙන් 362,999 ක් පමණ වන නමුත්, වයස අවුරුදු 15 – 29 කාණ්ඩයට අයත් තරුණ ශ්‍රම බලකාය තුළ රැකියා වියුක්තිය සියයට 21.6 ක ඉතා ඉහළ අගයක්ව පවතී. මෙම තරුණ තරුණියන්ට සුදුසු රැකියා අවස්ථා නොලැබීයාම අනාගතයේ ජාතික වශයෙන් අයහපත් ප්‍රතිඵල ගෙනදෙන කාරණයක් බව හඳුනාගත හැකි විය.

රැකියා විරහිත අය අතරින් සියයට 38.4 ක් වර්ෂයකට අධික කාලයක් සුදුසු රැකියාවක් සොයමින් සිටින අය බව සමීක්ෂණ දත්ත අනුව වාර්තාවීම විශේෂ අවධානයකට ලක් විය යුතුය.

(iii) තවද, වැඩ කරන වයසේ ජනගහනයෙන් අඩක් එනම්, මිලියන 7.14 ක් පමණ ජාතික ආර්ථිකයට සක්‍රීය දායකත්වයක් නොදක්වන බව පෙනී යයි. ඒ අතුරින් සියයට 20.2 ක් විධිමත් අධ්‍යාපනයෙහි හා වෘත්තීය අධ්‍යාපනයෙහි යෙදෙන අයද සියයට 19.8 ක් පමණ වන වයස්ගත ජනතාවද, සියයට 7.8 ක් පමණ වන පූර්ණ ආබාධිත අයද වෙන් කළ විට, බහුතරයක් තරුණයන් හා කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී දායකත්වයක් නොදක්වන බව පෙනී යයි. විශේෂයෙන්ම විධිමත් හෝ වෘත්තීය අධ්‍යාපනයක හෝ රැකියාවක නියුක්ත නොවන තරුණ තරුණියන් 750,864 ක් පමණ සිටින බව වාර්තා වී ඇති අතර, මොවුන් යැපෙන්නන් වශයෙන් හෝ නීත්‍යානුකූල නොවන ආදායම් මාර්ග මගින් ජීවනෝපාය සලසා ගැනීමටද නොයෙකුත් සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වීමේ අවධානම ඉහළ මට්ටමක ඇති කණ්ඩායමක් ලෙසද හඳුනා ගෙන ඇත.

(iv) මිලියන 21 ක ජනගහනයෙන් මිලියන 8.31 ක් පමණක් සේවා නියුක්තියක නියැලීමේදී ඉතා ඉහළ යැපීම් අනුපාතයක් දැනටමත් නිරීක්ෂණය වන අතර, අනාගතයේදී වයස්ගත ජනගහනය ඉහළයාමත් සමග මෙම යැපීම් අනුපාතිකය තිරසාර වශයෙන් දරා ගැනීමේ හැකියාවක් ශ්‍රී ලංකාවට නොමැතිවීමේ අවදානමක්ද පවතී. මේ සඳහා වන එකම විකල්පය වනුයේ වහාම සේවා නියුක්තිය ඉහළ නැංවීමයි.

(v) ශ්‍රම ආර්ථික විශ්ලේෂණකයන්ට අනුව, ලංකාවේ ජනගහනයෙන් අති බහුතරය වැඩ කළ හැකි වයසේ පසුවීම, ජනගහන සංයුතියේ ලාභාංශය (Demographic Dividend), රටක් වශයෙන් වේගවත් ආර්ථික වෘද්ධියක් අත් කර ගැනීම සඳහා මහඟු අවස්ථාවක් සලසා දී ඇති අතර, එය මනාව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය මගින් අවධාරණය කර ඇත.

### 3.3.4 ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතනවල මැදිහත්වීම

ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා අධීක්ෂණය සඳහා 2010 පෙබරවාරි 02 දිනැති අංක 1640/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව ඇති කර තිබුණි. ඒ අනුව ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය 2012 වර්ෂයේදී එවකට පැවති රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව සකස් කර ඇති අතර 2015 වර්ෂයේදී බලයට පත්වූ රජයේ උපදෙස් මත මෙම ප්‍රතිපත්තිය නැවත සංශෝධනය කර ඒ සඳහා 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මෙන්ම 2017 වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවද කටයුතු කරනු ලබයි.

ඒ අනුව ප්‍රතිපත්තියේ නියාමන කටයුතු සිදුකිරීමේ වගකීම වරින්වර වෙනස්වීම හා නිසියාකාරව නියාමන කමිටු පිහිටුවා නොතිබීම හේතුවෙන් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම ඇගයීම සහ අධීක්ෂණය දුර්වල මට්ටමක පවතින බවත්, විධිමත් පරිදි ක්‍රියාත්මක වන මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් නොමැති බවත් විගණනය නිරීක්ෂණය කෙරේ.

### 3.3.5 උපාධිධාරීන්ගේ රැකියා විරහිතභාවය සම්බන්ධ රාජ්‍ය මැදිහත්වීම

එවකට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ අරමුණු යටතේ දැක්වෙන රැකියා වියුක්තිය සහ ඌණ රැකියා නියුක්තිය පිටුදැකීම හා තරුණ ප්‍රජාව කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව නිපුණතාවයෙන් හෙබි මානව සම්පතක් ජනිත කිරීම දක්වා තිබුණු අතර ජනතාවගේ ආදායම් මට්ටම් වැඩි කිරීමේ හා තරුණ තරුණියන්ට පාසැල්/ වෘත්තීය / විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිම කිරීමෙන් අනතුරුව වාසිදායක රැකියා අවස්ථා සඳහා ප්‍රවේශවීමේ අවස්ථා සම්පාදනය කිරීමේ අභිලාශයෙන් මෙම අමාත්‍යාංශය 2015 වර්ෂයේ ස්ථාපිත කර තිබුණි.

i. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අනුව දිස්ත්‍රික්ක 25 තුල 2018 ජුනි 30 දිනට රැකියා වියුක්ත බාහිර උපාධිධාරීන් 26683 හා අභ්‍යන්තර උපාධිධාරීන් 28141 ක් වශයෙන් උපාධිධාරීන් 54824 ක් රැකියා විරහිතව සිටින බව නිරීක්ෂණය විය. මොවුන් 2012-2018 වර්ෂයන් වල උපාධිය සමත් වී ඇති අය බවද නිරීක්ෂණය විය.

ii. මේ සම්බන්ධව වර්තමානයේ කටයුතු කරන අමාත්‍යාංශය වන මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්ගේ අංක MNPEA/AD/E13/A.Q/2019 හා 2020 පෙබරවාරි 27 දිනැති ලිපිය ප්‍රකාරව දක්වා ඇත්තේ අදියර 03 ක් යටතේ (2018 අගෝස්තු 20, 2019 අගෝස්තු 01, 2019 සැප්තැම්බර් 18) අභ්‍යන්තර හා බාහිර උපාධිය ලබාගත් උපාධිධාරීන් 19,920 ක් සඳහා රු. 20,000 ක දීමනාවක් මත අභ්‍යාසලාභී උපාධිධාරීන් ලෙස පත්වීම් ලබා දී ඇති බවයි. ඒ අනුව සමස්ත රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් සියයට 36 ක් සඳහා පමණක් විසඳුමක් ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

### 3.3.6 තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව

(අ) තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ අධ්‍යාපනය හා සේවා නියුක්තිය අතර නොගැලපීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිර්දේශ අනුව මිනිස් බල සැලසුම් හා ප්‍රක්ෂේපණ නොමැතිවීම නිසා ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ඇති රැකියා පිළිබඳ තත්‍ය ගණන් ගැනීමක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) මිනිස් බල ප්‍රක්ෂේපණ හා ක්‍රමවත් රැකියා නියුක්ත ප්‍රතිපත්තියක් නොමැති වීම හේතුවෙන් විෂය පාඨමාලා හා අධ්‍යාපනය සැලසුම් කිරීම සම්බන්ධයෙන් වෙනස්කම් ඇති කිරීම බාධා වී ඇති බව දක්වා තිබුණි. අධ්‍යාපනයේ එකම පරමාර්ථය රැකියා බිහිකිරීම නොවුවද අධ්‍යාපනය රැකියා සංවේදී විය යුතු බව දක්වා තිබුණි.

### 3.3.7 කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

(අ) ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා නිපුණතාවයෙන් හෙබි ශ්‍රම බලකායක් ස්ථාපිත කර ගැනිම කෙරෙහි, 2017 සහ 2018 වසර වල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින්, එහි විධි විධානයන්ට යටත්ව, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ කාර්යභාර්ය සිදු කරයි. එහි පරිච්ඡේද අංක 06 හි දක්වා ඇති පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය මගින් " අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අනතුරුව, වෘත්තීය විෂය මාලාව ලියාපදිංචි වීමට අවස්ථාවන් සියලුම ළමුන් සඳහා ලබාදීමේ 13 න් වසරක සහතික කළ අධ්‍යාපන වැඩ සටහනක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

**(ආ) 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන**

මෙම වැඩසටහන මගින් අ.පො.ස උසස් පෙළ 12, 13 ශ්‍රේණි සඳහා වෘත්තීය විෂය ධාරාව හඳුන්වා දීම යටතේ අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටි සියළු සිසුන්ට සමත්, අසමත්භාවය නොසලකා ඇතුලත්වීමට අවස්ථාව සලසන අනාගත අභියෝග ජයගත හැකි වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණකින් නව වෘත්තීය විෂයන් 26 ක් ඇතුළත් විෂය ධාරාවක් හඳුන්වාදී තිබුණි. මෙම සංකල්පය කාලෝචිත එකක් වන බැවින් එය විධිමත්ව හා අඛණ්ඩව ක්‍රියාවට නැංවිය යුතු බව විගණනයේ අදහස් වේ.

### 3.3.8 විරැකියාව සම්බන්ධ දත්ත පවත්වා ගැනීම

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ත්‍රෛමාසික ශ්‍රම බලකා සමීක්ෂණය, ශ්‍රම සැපයුම හා ඉල්ලුම පිළිබඳ මූලික දත්ත, ප්‍රභවයක් ලෙස ක්‍රියාකරයි. රට පුරා භූගෝලීය වශයෙන් ව්‍යාප්තව ඇති, දළ වශයෙන් නිවාස 25,000 ක් පමණ වන, එම වත්මන් නියැදි ප්‍රමාණය රැකියා නියුක්ති විශ්ලේෂණය, මානව සම්පත් සැලසුම් කිරීම සහ රැකියා උපදේශනය සඳහා යොදා ගත හැකි ආකාරයේ ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු හා ඇස්තමේන්තු, වෘත්තීමය සහ කර්මාන්ත උප අංශ වශයෙන් බෙදා වෙන්කොට සැපයීම සඳහා ප්‍රමාණවත් නොවන බව ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියේ දක්වා ඇත. ඒ අනුව අවශ්‍යතාවය පරිදි නිවැරදි හා ප්‍රමාණාත්මක දත්ත සපයා ගත යුතු බව නිරීක්ෂණය වේ.

## 4. නිර්දේශ

(අ) සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය සියළු ශ්‍රී ලංකිකයන්ගේ ජීවිත කෙරෙහි බලපෑම් ඇති කරවන ජාතික සංවර්ධන ක්‍රියාදාමයේ අත්‍යාවශ්‍ය කොටසක් වන බැවින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය වේගවත් විය යුතු මෙවන් මොහොතක පාසල් අධ්‍යාපනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තීන් කඩිනමින් සංශෝධනය වී ක්‍රියාත්මක විය යුතු බව.

(ආ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනාවන් 2016 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණද විගණන දින වන විටත් එය කෙටුම්පත් මට්ටමේ පවතින නමුත් එහි දක්වා ඇති පහත සඳහන් යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බව නිර්දේශ කෙරේ.

i. ජාතික මට්ටමේදී සේවා සැපයිය හැකි සංවිධාන සහ සේවායෝජකයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම, බෙදාහැරීම විශ්ලේෂණය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය සිදු විය යුතු අතර, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය පුහුණු අධිකාරිය, විශ්වවිද්‍යාල, කම්කරු දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන හා වෘත්තීය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට කැමැත්තක් දක්වන වාණිජ මණ්ඩලය සහ කර්මාන්ත ක්ෂේත්‍ර වැනි සේවා යෝජකයන්ගේ සංවිධාන සහ පාසල් අතර ඇති සම්බන්ධීකරණයක් ඇති විය යුතුය.

ii. අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශනය හා අධ්‍යාපන උපදේශන ඒකකයක් පිහිටුවිය යුතු අතර එය ඒ හා සමාන පළාත්/ කළාප අධ්‍යාපන කාර්යාල සමඟ ජාල ගත කිරීම.

iii. දරුවන්ගේ අභියෝග්‍යතාවයන්, අධ්‍යාපන මාර්ගෝපදේශකත්වය සහ පවතින වෘත්තීය අවස්ථා පිළිබඳ දෙමව්පිය දැනුවත් කිරීමේ වැඩසටහන් පාසල් මගින් පැවැත්විය යුතුය. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල, වාණිජ මණ්ඩල සහ කර්මාන්ත ආයතන වැනි වෙනත් ජාතික මට්ටමේ ආයතන හා සම්බන්ධ වී මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමේ වැඩසටහන් පැවැත්වීම.

(ඇ) විද්‍යා අධ්‍යාපනය තවදුරටත් ප්‍රචලිත කරමින් STEM (Science, Technology Engineering and Mathematics)අධ්‍යාපනය පුළුල් සමෝදානිත ක්‍රම වේදයක් ඔස්සේ ප්‍රායෝගික ජීවන අත්දැකීම් හා බද්ධ කර ඉගැන්වීම සහ කලා සාහිත්‍ය විෂයයන්ද බද්ධ කරමින් විෂය ධාරා විවිධාංගීකරණය කිරීම.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයනයේදී කෙටිකාලීනව හා දිගුකාලීනව ක්‍රියාත්මක විය යුතු නිර්දේශ අතුරින් පහත දැක්වෙන ඒවා සුදුසු ආකාරයෙන් ක්‍රියාවට නැංවීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කළ යුතු බව නිරීක්ෂණය කෙරේ.

i. ඇතුළත් වීමේ සුදුසුකම පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී අ.පො.ස (සා.පෙළ) ගණිතය හා විද්‍යාව යන විෂයයන් පිළිබඳවද සළකා බැලිය යුතු වේ.

ii. තාක්ෂණවේදය විෂය ධාරාව ජනප්‍රිය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි වශයෙන් ක්‍රියාත්මක කළ යුතු වීම.

iii. කලා විෂය ධාරාව හදාරන සිසුන්ට පිටුවහලක් වීම පිණිස මූලික ගණිතය හා විද්‍යාව හඳුන්වා දීම පිළිබඳව සළකා බැලිය යුතු බව

(ඉ) තාක්ෂණවේදය විෂය ධාරාව ප්‍රවර්ධනය කිරීම සඳහා දිවයිනේ සියලු පලාත්වල අවශ්‍යතාවය පරිදි මානව හා භෞතික පහසුකම් සපයා දිය යුතුය.

(ඊ) අ.පො.ස. උසස් පෙළ කලා විෂය ධාරාව හදාරන සිසුන් වෙනුවෙන් විෂය විවිධාංගීකරණය සහිතව ව්‍යවහාර ඉංග්‍රීසි/ Business English හා ICT Application for Arts Subjects වැනි පුළුල් වැඩසටහන් නිශ්චිතවම දියත් කිරීම.

(උ) යෝජිත ශ්‍රී ලංකා මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියේ පාසල් අධ්‍යාපනය සම්බන්ධව දක්වා ඇති පහත නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බවට නිර්දේශ කෙරේ.

i. සිසුන් ද්විතියික පාසලේ ඉගෙනුම ලබන කාලයේදීම ඔවුන්ට තෝරාගැනීම සඳහා විකල්ප මංපෙත් සහ විෂය ධාරා හඳුනා ගතයුතුය. මෙමගින් සාම්ප්‍රදායික අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ මංපෙත් වලින් පමණක් නොව විකල්ප මංපෙත් මගින් අනාගත ප්‍රගතිය කරායාමට හැකිවනු ඇත. එසේම පාසල් හැර යන සියල්ලන්ටම අනිවාර්යය අංගයක් ලෙස පාසැල් තුළදීම තාක්ෂණ අධ්‍යාපනය සම්බන්ධව වෘත්තීය මාර්ගෝපදේශනය හඳුන්වා දිය යුතු බව සහ විශේෂ නිපුණතා සහිත සිසුන් හඳුනාගැනීමට හා එම කුසලතා පෝෂණය කිරීමටද සිසුන්ට මෘදු කුසලතා හා හැකියාවන් ලබාදීමටද වෘත්තීය මාර්ගෝපදේශනය පහසුකම් සපයා දිය යුතු බව .

ii. සන්නිවේදන කුසලතා වර්ධනයට පහසුකම් සැලසීම සඳහා ඉංග්‍රීසි ඉගැන්වීම තවදුරටත් ශක්තිමත් විය යුතු බව.

iii. ද්විභාෂා අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ ද්විතියික ශ්‍රේණිවල සිසුන්ට තෝරාගත් විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනීමේ විකල්පය සලසා දෙනු පිණිස රටපුරා ඇති තෝරා ගත් පාසල් තුළ ද්වී භාෂා අධ්‍යාපනය සඳහා ඇති ඉඩකඩ ව්‍යාප්ත කිරීම තවදුරටත් සිදු කළ යුතුය. එකී විෂයයන් අ.පො.ස සාමාන්‍ය පෙළ හා අ.පො.ස උසස් පෙළ විභාගවල දී තමන් කැමති භාෂා මාධ්‍යයකින් පෙනී සිටීමේ අවස්ථාව සැපයෙනු පිණිස මෙම කාර්යය සඳහා අවශ්‍ය ගුරුවරුන් ලබාදීම බලධාරීන්ගේ වගකීම විය යුතුය.

iv. දේශීය හා විදේශීය රැකියා නියුක්ති ක්ෂේත්‍රය තුල අනෙකුත් විදේශීය භාෂා වඩා වැදගත් බවට පත්වෙමින් තිබෙන හෙයින්, දිවිතීයික මට්ටමේදීද ඉංග්‍රීසි බසට අමතරව විදේශීය භාෂා ඉගෙන ගැනීමට අවස්ථාව දිවයින පුරා සියලු පාසල් සිසුන්ට සලසා දීම.

v. ඉහළ ඉල්ලුමක් ඇති නාගරික පාසල්වල පවත්නා පහසුකම් හා සමාන පහසුකම් සහිත පාසල් නාගරික නොවන ප්‍රදේශවල පිහිටුවීම හා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට මනා පහසුකම් සහිත ද්විතීයික පාසල් අවම වශයෙන් 3 ක් වත් පිහිටු වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. වැඩි දියුණු කළ පාසල්වල පවතින විද්‍යාගාර පහසුකම් කොට්ඨාශයේ ඇති අනෙකුත් පාසල්වල ශිෂ්‍යයන්ටද භාවිතා කළ හැකි වන පරිදි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා ද්විතීය පාසල්වලදී සාර්ථකවීමට පදනමක් ලෙස ප්‍රාථමික පාසල්වල ධාරිතාව ඉහළ නැංවීමට අවධානය යොමු කිරීම.

(ඍ) ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියේ උසස් හා වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධයෙන් දක්වා ඇති පහත සඳහන් නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක විය යුතු බව නිර්දේශ කෙරේ.

i. විශ්ව විද්‍යාල තුල පවතින මානව හා භෞතික සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා උපාධි පාඨමාලා හැදෑරීමේ සම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් වෙනස් වී සිසුන් වැඩි සංඛ්‍යාවකට උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීමට අවස්ථාව සැලසෙන පරිදි එම ආයතනවලින් සැපයෙන උසස් අධ්‍යාපන අවස්ථා වැඩි කළ යුතුය. මෙහිලා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය මෙන්ම මාර්ග ගත ක්‍රමය (Online) මගින් සැපයෙන උසස් අධ්‍යාපන

අවස්ථා යොදා ගතහැකි අතර, විවිධ ක්‍රමවලින් උසස් අධ්‍යාපන පාඨමාලා සැපයීම ප්‍රවර්ධනය විය යුතුය. පිහිටීම, ප්‍රවේශ වේලාවන් යනාදිය සම්බන්ධයෙන් නම්‍යශීලි වන ලෙස දුරස්ථ ක්‍රමයට උසස් අධ්‍යාපන අවශ්‍යතා ඉටු කර දිය යුතුය. අධ්‍යාපනයේ ගුණාත්මක බවට හානියක් නොවන පරිදි මෙම පියවර ගනු ලැබිය යුතුය.

ii. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැළපෙන ආකාරයට මෙන්ම රැකියා අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයට අධ්‍යයන ආයතන සහ කර්මාන්ත අතර ඇති සම්බන්ධතා තවදුරටත් වර්ධනය කරමින් විශ්වවිද්‍යාලවල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල පවත්වා ගෙන යනු ලබන, මේ දක්වා යාවත්කාලීන නොකළ අධ්‍යයන පාඨමාලා යාවත්කාලීන කිරීමට කටයුතු කිරීමටත් වැඩ ලෝකයට ගැලපෙන අවශ්‍යතා සපුරාලිය හැකි ආකාරයේ පාඨමාලා සැලසුම් කිරීමත්/ ලෝක බැංකුව සහ වෙනත් නියෝජිත ආයතනවල අරමුදල් ප්‍රතිපාදන මත දැනටමත් ආරම්භ කර ඇති පාඨමාලාවල ගුණාත්මක බව වර්ධනය කිරීමේ වැඩසටහන්වල ක්‍රියාත්මකභාවය තවදුරටත් ශක්තිමත් කළ යුතුය.

iii. රැකියා අවස්ථා සහ රැකියා අපේක්ෂිත උගත් තරුණ පිරිසගේ බලාපොරොත්තු අතර පවතින කුසලතා මට්ටම් පිළිබඳ ඇති නොගැලපීම් අවම කිරීම සඳහා විශ්වවිද්‍යාල මඟින් කටයුතු සම්පාදනය කළ යුතුය. සේවා සංගම්වල දායකත්වය සහිතව සංවිධානය කරනු ලබන සීමාවාසික පුහුණු වැඩසටහන් එයට ඇතුළත් කළ යුතුය.එසේම, සුදුසු පරිදි රැකියා වෙළඳපලේ ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය වන පොදු කුසලතාවයන්, මෘදු නිපුණතා ඇතුළු විවිධ ජීවන කුසලතා සහ වැඩ පිළිබඳ ධනාත්මක කුසලතා අත්පත් කර ගැනීමට සියලුම ශිෂ්‍යයන් පුහුණු කළ යුතුය.

iv. ගුණාත්මක බව හා පිළිගැනිම පිළිබඳ අවශ්‍යතාවයන් නියාමනය කිරීම සඳහා යම් පාලන ක්‍රියාමාර්ග සහිතව, රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල සහ අනෙකුත් උපාධි ප්‍රදාන ආයතන දිරිගන්වනු ලැබිය යුතු අතර එවන් ආයතන ඇති කිරීම පිළිබඳව නෛතික විධිවිධාන ඇති කළ යුතුය.

v. ශිෂ්‍යයන්ටද, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට සහ පර්යේෂකයන්ට දිගින් දිගටම විදේශ අත්දැකීම් ලබාගත හැකිවන පරිදි දේශීය විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර ඇති සම්බන්ධතා ප්‍රවර්ධනය කළ යුතුය. ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල සහ සේවා යෝජනීයභාවය වැඩිදියුණු කිරීම සඳහා එක් අතකින් දේශීය විශ්වවිද්‍යාල අතරද අනෙක් අතට දේශීය විශ්වවිද්‍යාල සහ

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ආයතන, කර්මාන්ත හා වෘත්තීය ආයතන අතරද සම්බන්ධතා වැඩිදියුණු කිරීමට අනුබල දිය යුතුය. මෙම සම්බන්ධතා හරහා රටතුල පවතින සම්පත් එකිනෙක ආයතන අතර බෙදා හදා ගැනීම ක්‍රියාවලියක් ඇතිකිරීම.

vi. ස්වාධීන ඉගෙනුම් කටයුතු කරගෙන යාමට හා පර්යේෂණ වල යෙදීමට ශිෂ්‍යයන් පුහුණු කිරීම සඳහාත් ශාස්ත්‍රඥයින්ට වැදගත් ක්ෂේත්‍රවල තම දැනුම වර්ධනය කරගැනීමට හැකිවන පරිදිත් විශ්වවිද්‍යාල වල ඇති පර්යේෂණ පහසුකම් වැඩිදියුණු කළ යුතුය. පර්යේෂණ මගින් සිදු කෙරෙන සොයාගැනීම් පෘථුල ලෙස ව්‍යාප්ත කරවනු වස් සන්නිවේදන හැකියාව වැනි පර්යේෂකයින්ට අදාළ වන කුසලතා වර්ධනය කළ යුතුය. පොළී රහිත ණය මත විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ලැප්ටොප් පරිගනක ලබාදීම හා සියලුම විශ්වවිද්‍යාල තුල නිදහස් WIFI කලාප ස්ථාපිත කිරීම මගින් ශිෂ්‍යයන්ට යම් නියාමනයක් සහිතව ප්‍රායෝගිකව ඉගෙන ගැනිමට අවස්ථා හා අන්තර්ජාලය තුලින් අධ්‍යයන සම්පත්වලට ප්‍රවේශ වීමට අවස්ථා ලැබිය යුතුය.

vii. රාජ්‍ය අංශයේ රැකියාවලට තරුණ තරුණියන් පුළුල් වශයෙන් දක්වන බලවත් කැමැත්ත ඔවුන් අතර ඇති ඉහළ මට්ටමේ හා දීර්ඝ කාලීන විරැකියාවට හේතු වී ඇතැයි බොහෝ දෙනා පිළිගනිති. පෞද්ගලික අංශයේ රැකියා වඩාත් ආකර්ශනය කිරීමට අමතරව මෙම ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් සොයාගැනීම සඳහා තරුණ තරුණියන් සහ ඔවුන්ගේ දෙමාපියන් තුල යම් යම් අංශවල රැකියාවන්ට වඩා ආකර්ශනයවීමේ ආකල්ප වෙනස් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. මේ සම්බන්ධයෙන් පහත අංශ ඔස්සේ ක්‍රියාත්මක වීමට සැලසුම් කළ යුතුය.

- සමස්ත රාජ්‍ය සේවය තුල එහි පවතින විවිධ රැකියා කාණ්ඩ තුල පැවතිය යුතු රැකියා ප්‍රමාණයන් ගැන ජාතික වශයෙන් එකඟතාවයක් ගොඩ නංවා ගැනීම, (ජාත්‍යන්තර සංසන්දනයේදී, වර්තමාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ නිලධාරී සංඛ්‍යාව ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ඉතා ඉහළ ගනී.)
- සුදුසුකම් හා පුහුණු මට්ටම් අවධාරණය කරමින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ පරිචයන් ප්‍රතිසංස්කරණයට ලක් කිරීම තුලින් එම සේවයට ඇතුළත්වීමට බලාපොරොත්තුවෙන් සිටින සංඛ්‍යාව අඩු කිරීම; සහ

viii. යෝජිත ශ්‍රී ලංකා මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ප්‍රකාරව ශ්‍රම වෙළඳපොල තොරතුරු එක් රැස් කිරීම හා බෙදා හැරීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණ කිරීම සඳහා ප්‍රමාණවත් ව්‍යවස්ථාපිත සහ පරිපාලනමය බලතල සහිත ප්‍රබල ආයතනයක් පිහිටුවීම සම්බන්ධව කර තිබූ නිර්දේශය බල ගැන්වීම.

ix. තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) ශක්‍යතාවයන් නංවාලීම හා ශ්‍රී ලංකා ආර්ථිකයට අන්තර්ජාතික සහභාගීත්වය දිරි ගැන්වීම සඳහා ගෝලීය ලෙස තරඟකාරී දක්ෂතාවලින් සමන්විත උපාධිධාරීන් පිරිසක් බිහි කිරීමට විශ්වවිද්‍යාල වලට හැකියාව ඇති කර ගත යුතු බව.

x. ජාත්‍යන්තර ප්‍රමිතිද, ශ්‍රී ලංකාවේම ඓතිහාසික ප්‍රමිති අනුව ගත්කල උසස් අධ්‍යාපනය වෙනුවෙන් රජය වැයකරන පුනරාවර්තන හා ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම් අද පහළ මට්ටමක පවතී. එයට අනුරූපව, විශ්වවිද්‍යාල තුළ නවීන පහසුකම් වැඩිදියුණු වී ඇත්තේ ප්‍රමාණවත් නොවන තරමකින් හා මන්දගාමී වේගයකිනි. ඒ අනුව සේවා නියුක්තිය සඳහා මානව සම්පත් පුහුණු කිරීමේ කටයුතු එම ආයතන තුළ අසතුටුදායක වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ගුණාත්මක බවේ පරිහානිය අභ්‍යන්තර කළමනාකරණය හා ශිෂ්‍ය අසහනය පිළිබඳ ප්‍රශ්න නිසා වඩාත් තීව්‍ර කර තිබීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම.

xi. උපාධි පාඨමාලා අතරින් කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා හා වාණිජ පීඨවල උපාධිධාරීන් අතර විරැකියාව නැවත නැවත ඇතිවන ගැටළුවකි. මෙම රැකියා විරහිත උපාධිධාරීන් හට රාජ්‍ය අංශයේ රැකියාවන්වල සේවයේ නියුක්ත කරවීම උග්‍ර ප්‍රශ්නකාරී තත්ත්වයට පත් වී ඇත. මෙලෙස රජයෙන් රැකියා ලබා දෙනු ඇතැයි විශ්වාසය මත උපාධිධාරීන් කටයුතු කිරීම හේතුවෙන් වෙළඳපොළ ඉල්ලුමට සරිලන කුසලතාවයන් විශ්වවිද්‍යාල තුළදීම ළඟාකර ගැනීමට හා උපාධියෙන් පසු රැකියා සෙවීමට විශ්වවිද්‍යාල සිසුන් තුළ පෙළඹවීම් ඇතිවීම අවම වී ඇත. එමෙන්ම රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවයන් සළකා බැලෙන අවධියක රැකියා විරහිත උපාධිධාරීන් සියළු දෙනාම රාජ්‍ය අංශයට උකහා ගැනීමද තිරසාර විසඳුමක් නොවීම මත මේ පිළිබඳව කඩිනම් අවධානය යොමුකළ යුතු වීම.

xii. විශ්වවිද්‍යාලවල මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා හා වාණිජ වැනි පීඨ වල ඉගෙන ගන්නා උපාධිධාරීන් සම්බන්ධයෙන් පැහැදිලිවම ශ්‍රම වෙළඳපොළේ පවතින ඉල්ලුම සැපයුමට වඩා අඩු මට්ටමක පවතී. කෙටිකාලීන විසඳුම් ලෙස ඇතැම් විෂය ක්ෂේත්‍රවලට ශ්‍රම වෙළඳපොලට ඵලදායක ලෙස අවශෝෂණය කරගත හැකි වන පරිදි වෙළඳපල සමීක්ෂණ සිදුකර ඒ අනුව විෂය මාලා සංවර්ධනයට කඩිනමින් කටයුතු කිරීම.

(එ) විශ්වවිද්‍යාල තුළින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා රැකියා වෙළඳපොල අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් සැලසුම් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධීකරණයක් සහ නියාමනයක් සිදුකිරීම සඳහා බලයලත් අධිකාරියක් ඇති කිරීමේ ඉඩකඩ සළකා බැලීම.

(ඒ) රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හා පෞද්ගලික අංශයේ රැකියා සඳහා බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාල මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා පිළිබඳ දැනුවත්භාවය ඉතා වැදගත් වන බැවින් ඒ සඳහා සුදුසු නියාමනයක් ඇති කිරීම.

(ඔ) රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශවල, සමස්ත මිනිස් බල අවශ්‍යතාවය (බුද්ධිමතුන්, වෘත්තීකයන්, පර්යේෂකයන් හා ව්‍යවසායකයන්) රජය විසින් පූර්ණ අධීක්ෂණයක් යටතේ තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.

(ඕ) ප්‍රතිපත්ති සම්පාදකයින් (ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු) විසින් සමස්ත මිනිස් බල අවශ්‍යතාවය මත උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා සුවිශිෂ්ඨ බුද්ධිමතුන්, වෘත්තිකයන් බිහි කිරීම සඳහා ජාතික උසස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සහ ජාතික උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළින් වාර්ෂිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල පද්ධතිය හරහා බිහිවිය යුතු උපාධිධාරීන් සංඛ්‍යාව සහ උපාධිධාරීන් බිහි විය යුතු ක්ෂේත්‍ර, එක් එක් ක්ෂේත්‍ර වලින් බිහිවන උපාධිධාරින් සංඛ්‍යාව ඵලදායී හා වාසිදායක රැකියා අවස්ථා සඳහා ප්‍රවේශවීමේ අවස්ථා සම්පාදනය කිරීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2020 නොවැම්බර් 18 දින